# 2026.03.10 දින පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ පවත්වන ලද මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව

## රැස්වීම සඳහා සහභාගිවූ ගරු මන්ත්‍රීවරුන්

1. ගරු ප්‍රාදේශීය සභා සභාපති යහලවෙල ගෙදර සංජීව කරුණාසාගර මහතා
2. ගරු ප්‍රාදේශීය සභා උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අලහකෝන් පතිරන්නැලාගේ තරංග වම්පික අලහකෝන් මහතා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි දෙලංකාගේ නිමාලි දිල්හානි මෙනෙවිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කඩුකාර මුදියන්සේලාගේ නන්දසිරි මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහමායාගොඩගේ විරාජ් මලින්ද ඩයස් මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ ප්‍රදීප් සුජීව හේරත් මහතා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඉදිරිප්පුලිගේ සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි මුතුගල නිශාන්ති ගුණතිලක මහත්මිය
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පනම්බර මුදියන්සේලාගේ කුමාරසේන ජයලත් මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අගාරේ ගෙදර දූරයාලගේ රංජිත් ප්‍රේමලාල් මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි නිමල්කා කොටඹගේ මහත්මිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්පටිදේවගේ ලාලිත ඉඳුනිල් මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුරුප්පු මුදියන්සේලාගේ අජිත් තිලකසිරි මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හේරත් මුදියන්සේලාගේ සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේන්ද්‍ර ගල්අද්දලාගේ අජිත් ලක්ෂ්මන් මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අකුරන් ජේඩි දූරයලාගේ ඉෂාන් මධුශංක පීරිස් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසේ හේවගේ මාලක අරුණ කුමාර මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එදිරිසිංහ ආරච්චිලාගේ ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බ්‍රහ්මචාරිගේ සුදත් උදය කුමාර මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි සේනානායක මුදියන්සේලාගේ සජිනා සුරංගි මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මුදියන්සේලාගේ දිලිප් ජයසිංහ මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රත්නායක මුදියන්සේලාගේ උපුල් නිශාන්ත මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විස්කම් නන්දන වඩු ආචාරිගේ රංජිත් නවරත්න මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාපා අශෝක හේරත් මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්ද්‍රාධිපතියලාගේ රංජිත් අබේපාල මහතා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්හොටි හලුවන්නැහැලාගේ රංජිත් උපාලි මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රාජගුරු දිසානායක මුදියන්සේලාගේ ජයන්ත දිසානායක මහතා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බන්නැහැක මුදියන්සේලාගේ ශ්‍රියානි මානෙල් බන්නැහැක මහත්මිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි වීරරත්න තෙන්නකෝන් මුදියන්සේලාගේ චාන්දනී දීපිකා රත්නායක මහත්මිය
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි රාජකරුණානායක මුදියන්සේලාගේ නිලන්ති විජේසිංහ මහත්මිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහමඩ් කබීර් රිෆාක් හුසේයින් මහතා
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දොලවත්තගේ දොන් සිරන්ත පද්මලාල් මහතා
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මල්ලව ආරච්චිලාගේ මංජුල ප්‍රසන්න මල්ලව ආරච්චි මහතා

**රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන්**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මැණිකාමාර දූරයලාගේ මනෝ කුමාර එදිරිසිංහ මහතා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ චාමින්ද දසනායක මහතා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහම්මදු තාහීර් මොහමඩ් තස්ලිම් මහතා

**<u>ආගම සිහි කිරීම.</u>**

ප්‍රථමයෙන් ජාතික ගීය වාදනය කිරීමෙන් , ආගම සිහිකිරීමෙන් අනතුරුව මිය ගිය රණවිරුවන් සිහිකර ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට පමණ ගරු සභාවේ කටයුතු න්‍යාය පත්‍රානුකූල ආරම්භ කරන ලදී. 2026 මාර්තු මස මහා සභා රැස්වීමට සහභාගී වන ගරු උපසභාපති ඇතුළු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය ,ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩල නිලධාරීන් , මාධ්‍යවේදීන් ඇතුළු සහභාගී වී සිටින සියළුදෙනාට ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා සුභ උදෑසනක් ප්‍රාර්ථනා කරන ලද අතර සියළුදෙනාම ගෞරවයෙන් පිළිගන්නා ලදී.

## <u>06 (අ). 1.පසුගිය මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම .</u>

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

2026.02.10 වන දින පැවති මහා සභා රැස්වීමේ රැස්වීම් වාර්තාව සම්මත කරගන්නා ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

සුභ උදෑසනක් ගරු සභාපතිතුමනි, ගරුසභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගැනීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් අවසරයි. ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි. ගරු උප සභාපතිතුමා විසින් ගෙන එන ආ ඒ යෝජනාව මා විසින් ස්ථීර කරනවා.

**ඒ අනුව පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඒ යටතේ පඬුවස්නුවර ප්‍රාදේශිය සභාවත්, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයත්, පඬුවස්නුවර බටහිර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයත්,පොලිසිය ඇතුළු රාජ්‍ය ආයතන ඒකාබද්ධව ජංගම සේවයක් මාර්තු මස 13 වෙනිදා උදේ 9.00 ට කෝන්වැව විහාරස්ථානයේදී පැවැත්වෙනවා.ඒ බව මේ වෙනකොටත් ඒ ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් හරහා ජනතාව දැනුවත්කොට තිබෙනවා.ඒ සඳහා ඒ ප්‍රදේශයේ ඉන්න ජනතාවට ඒ බටහිර වෛද්‍ය සේවාව, ඒ වගේම ආයුර්වේද වෛද්‍ය සේවාව ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිද්ධවෙන ජංගම සේවා ටිකත්, අපේ ප්‍රාදේශිය සභාවත් අපේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා සිද්ධ වෙන සේවා ටික එදිනට ලබා ගන්න පුළුවන්.සම්බන්ධවෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඊළඟට සමහර සමාජ මාධ්‍ය භාවිත සම්බන්ධයෙන් යමක් කියන්න ඕනකම තියෙනවා.මොකද සමාජ මාධ්‍ය ඕනෑම කෙනෙකුට භාවිතා කරන්න පුළුවන්.හොද දේ කියන්නත් පුළුවන්. නරක දේ කියන්නත් පුළුවන්.වැරදි දේ සමාජ ගත කරලා වැරදි දේ ස්ථාපිත කරන්න පුළුවන් කම තියෙනවා.ඒ නිසා අපි දැක්කා පහුගිය දිනයේ පහුගිය සභාව අවස්ථාවේ අපේ දිල්හානි මන්ත්‍රීතුමිය කරපු ප්‍රකාශයක්.ඒ ප්‍රකාශෙ ඇතුළෙ තියෙන්නෙ අන්න අර මාර්ග වල නම් සම්බන්ධයෙන් ගැටළුවක්.ඒක නිවැරදි කරලා ඔබතුමාලගෙ අතට දැන් ලබා දීලා තියෙනවා.එතකොට මහ පොළොව ඇතුළෙ සියළු මාර්ග හදලා තියෙන්නෙ.නිකම් පාරවල්

වලට නම්දාලා සල්ලි ගසා කාපු සංස්කෘතියක් මේක ඇතුළෙ සිද්ධ වෙලා නෑ. සිද්ධ වෙන්නෙත් නෑ.සිද්ධ වෙන්න ඉඩ තියන්නෙත් නෑ.ඒ නිසා බලය මාරු වුනාට පස්සෙ හොරකම, වංචාව,දූෂණය, නාස්තිය කියන එක දේශපාලන අධිකාරිය ඇතුළෙ ඉවර කරලා තියෙන්නෙ.රාජ්‍ය යාන්ත්‍රණය ඇතුළෙ තවම සහමුලින්ම අපිට අවසන් කරගන්න බැරි වෙලා තියෙනවා.ඒ නිසා ඒ සම්බන්ධයෙන්ලේබල් අලවන්න උත්සාහ කරන එක සම්බන්ධයෙන් සොරි, කණගාටුයි කියන්න තමයි සිද්ධ වෙන්නෙ.සමාජ මාධ්‍ය භාවිතා කරලා මඩ තවරන්න උත්සාහ කරාට වැඩක් නෑ. සොරි.

## (ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.

## 1.නිවාඩු අනුමත කිරීම.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මන්ත්‍රීතුමා, මනෝකුමාර එදිරිසිංහ මන්ත්‍රීතුමා , එම් ටී.එම් තස්ලිම් මන්ත්‍රීතුමා නිවාඩු ඉල්ලලා තියෙනවා. එතුමන්ලගෙ නිවාඩු අනුමත කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමියගෙනුත් ගෞරවනීය මන්ත්‍රි මණ්ඩලයෙනුත් අවසරයි.ගරු සභාපතිතුමනි, අද දින නිවාඩු ඉල්ලලා ඇති ගරු මන්ත්‍රීවරුන්හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඩී.ජී.බී.එම්.චාමින්ද දසනායක මහතා වෙත සහ ගරු මන්ත්‍රී එම්.ඩී. මනෝ කුමාර එදිරිසිංහ මහතා හා ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා වෙත නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.**

**II.2026.02.13 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

2026.02.13 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා,ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා,ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, 2026.02.13 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රිවරුන් හට නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

**<u>ගරු මන්ත්‍රීනී ඊ.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය- (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි.එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.02.13 වන දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා ,ගරු මන්ත්‍රී එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා, ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**III.2026.02.13 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම.**

ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා

2026.02.13 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා , ගරු මන්ත්‍රි එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා,ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන මෙන් ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)

2026.02.13 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු මන්ත්‍රීවරුන් නිවාඩු අනුමත කිරීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා

ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026.02.13 වන දින පැවති ප්‍රසම්පාදන කමිටුව සඳහා සහභාගී නොවූ ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා, ගරු මන්ත්‍රී එම්.ජී විරාජ් මලින්ද ඩයස් මහතා, ගරු මන්ත්‍රී එම්.ඩී මනෝ කුමාර එදිරිසිංහ මහතා, ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා, ගරු මන්ත්‍රී එම්.ටී.එම්.තස්ලිම් මහතා ,ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා , ගරු මන්ත්‍රි එච්.එම්.සමරසිංහ කීර්ති බංඩාර හේරත් මහතා,ගරු මන්ත්‍රී ඩී.ඩී.එස් දොලවත්ත මහතා වෙත නිවාඩු අනුමත කරන ලෙසට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

## (ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත

## (ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා

ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා

මීළඟට හදිසි යෝජනා කිහිපයක් තියෙනවා.න්‍යාය පත්‍රයට ඇතුළත් කරගන්න.මා විසින් ඉදිරිපත් කරනවා පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී වශයෙන් කටයුතු ජයනාලි රත්නසිකා ටේලර් (785252560V) මහත්මිය 2026.03.01 දින සිට විශ්‍රාම යාම හේතුවෙන් චෙක්පත් සඳහා අත්සන් කිරීමේ දෙවන අත්සන්කරු ලෙස හේරත් මුදියන්සේලාගේ දුලානි හේරත් මැණිකේ (198978700460) මහත්මිය වෙත බලතල පැවරීම සුදුසු බවට ගෙන එන යෝජනාව . එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)

ගරු සභාපතිතුමනි, එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසුයි කියා මා යෝජනා කරනවා.

ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර ඇති පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී වශයෙන් කටයුතු කළ ජයනාලි රත්නසිකා ටේලර් (785252560V) මහත්මිය 2026.03.01 දින සිට විශ්‍රාම යාම හේතුවෙන් චෙක්පත් සඳහා අත්සන් කිරීමේ දෙවන අත්සන්කරු ලෙස හේරත් මුදියන්සේලාගේ දුලානි හේරත් මැණිකේ (198978700460) මහත්මිය වෙත බලතල පැවරීම සුදුසු බවට ගෙන එන යෝජනාව රැස්වීම් රීති 11(8)**

**යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මීළගට .මා විසින් ඉදිරිපත් කරනවා 2026.02.13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ අංක 34 යටතේ නිර්දේශ කරන ලද පරිදි පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 06 ක් අළුතින් බඳවා ගැනීම සම්බන්ධ යෝජනාව. එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට යෝජනා සම්මත කරදෙන්න.

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)</u>**

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසුයි කියා මා යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

එම යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ගරු සභාපති වයි. ජී. සංජීව කරුණාසාගර මහතා විසින් ගරු සභාවට ඉදිරිපත් කර 2026.02.13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ අංක 34 යටතේ නිර්දේශ කරන ලද පරිදි පඹුවස්නුවර ප්‍රාදේශිය සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 06 ක් අළුතින් බඳවා ගැනීම සම්බන්ධ යෝජනාව රැස්වීම් රීති 11(8) යටතේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**(ඉ) I.<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). I දරණ යෝජනාව</u>**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**<u>ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා</u>**

කෝන්වැව ග්‍රාම සේවා වසම තුල කෝන්වැව පංසල අසල සිට සී.පී.සරත් ප්‍රේමචන්ද්‍ර මහතාගේ නිවස අසල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයෙන් සහ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන්ගෙන් අවසරයි.මීට අවුරුදු 19 කට විතර උඩදි අපේ ප්‍රදේශයේ රුපියල් ලක්ෂ 2 ක පමණ ආසන්න මුදලක් වියදම් කරලා අළුතින් පාරක් හැදුවා පංසල අසල ඉදලා මීටර් 200 ක් විතර ඉස්සරහට දුරින්. මේ වෙනකොට ඒ මාර්ගය ඉතාම අබලන් තත්වයකට පත්වෙලා.කොන්ක්‍රිට් දැම්මෙ.කළුගල් යටට දාලා.මේ වෙනකොට ඒ කොන්ක්‍රිට් පාර කැඩිලා බිදිලා ගිහිල්ලා කළුගල් මතුවෙලා තියනවා.පයින්වත් ගමන් කරන්න බැරි තත්වයක් උදාවෙලා තියනවා.ඒ නිසා මම ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රි මණ්ඩලයෙන් මම ඉල්ලීමක් කරනවා.පංසල ආසන්නයෙන් ටවුමට පිවිසෙන ප්‍රධාන මාර්ගයක් විදිහට මෙමෙ මාර්ගයේ මීටර් 150,200 කට ආසන්න ප්‍රමාණයක් තමා තියෙන්නෙ.එම නිසා මේ මාර්ගය අපේ ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගයක් හැටියට මේ ප්‍රාදේශීය සභාවෙ මාර්ගයක් නිසා ප්‍රාදේශිය සභාව තුලින් සකස් කර දෙන ලෙස ඉල්ලීමක් කරනවා.

**ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා විසින් ඉදිරිපත් කළ කෝන්වැව ග්‍රාම සේවා වසම තුල කෝන්වැව පංසල අසල සිට සී.පී.සරත් ප්‍රේමචන්ද්‍ර මහතාගේ නිවස අසල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**II.** **ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). II දරණ යෝජනාව**
මා විසින් ඉදිරිපත් කරන යේජනාව. ඉඩම් කට්ටි කිරීම හෝ සංවර්ධනය කිරීම පිළිබඳව තීරණ ගැනීම පිණිස නිශ්චල සහ නිවාස දේපල සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් අයගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සුදුසු බව මා විසින් යෝජනා කරනවා.
1.පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා - කමිටුවේ සභාපති
2. පළාත් පාලන ආයතනයේ ලේකම් - කමිටුවේ ලේකම්
3. පළාත් පාලන ආයතනයේ කාර්මික නිලධාරිවරයෙක්- කමිටු සාමාජික
4.අදාළ බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක - කමිටු සාමාජික
5.ආදායම් පරීක්ෂක හෝ ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ ආදායම් ප්‍රවර්ධන නිලධාරී හෝ පරිසර නිලධාරී යන අයගෙන් එක් අයෙක් - කමිටු සාමාජික බවට පත් කිරීම. මොකද මේක කමිටුවලින් නෙමේ ගියෙ.සභාපතිවරයාගෙ අභිමතය පරිදි ගියෙ.නමුත් විනිවිදභාවයෙන් කටයුතු කිරීම සඳහා කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවය තියෙනවා.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)**
ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**
සභාපතිතුමනි, මමත් මේ කාරණාව පිලිබඳ දැක්කා.ඔබතුමා යෝජනාවක් ඉදිරිපත්කරලා තියෙනවා. විශේෂයෙන්ම අද අපිට මේ යෝජනා පත්‍රය තුළ විශේෂ යෝජනා විසි ගණනක් වාගේ ඉදිරිපත් කරලා තියෙනවා.ඒ යෝජනාව ඇතුළෙ ඔබතුමා මී වදයක වද බදිනවා වාගේ පැණිවද,හකුරුවද, කිරිවද ඒ ඔක්කොම වද ඇතුලත් කරලා තියෙනවා මං දකිනවා. ඔබතුමා ඉදිරිපත් කරලා තියෙන යෝජනාව ඉඩම් කට්ටි කිරීම හෝ සංවර්ධනය කිරීම පිලිබඳව තීරණ ගැනීම පිණිස නිශ්චල සහ නිවාස දේපල සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම කියන එක. ඉතින් හැබැයි ගරු සභාපතිතුමනි,මේ කාරණාව අපිට පළාත් සභාව හරහා ප්‍රාදේශීය සභා ආයතන තුලට ව්‍යවස්ථා මඟින් අතුරු ව්‍යවස්ථා මඟින් මේ මේ කාරණා මේ ආකාරයෙන් සිද්ධ කරන්න කියලා අපිට කරුනු පැහැදිලි කරලා තියෙනවා. ඔබතුමාගෙ මේ යෝජනාවලිය බලපුවාම අපිට නිකම් සිංහල භාෂාවේ නැති වචනයක්නිකම් අංඥකොරොස් වෙනවා වගේ.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**
ඔබතුමා යෝජනාවලිය ගැනද කථා කරන්නෙ.මේ යෝජනාව ගැනද? මේ යෝජනාව ගැන කථා කරන්න ඔබතුමාට අයිතියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**
මේ යෝජනාව අපිට ප්‍රාදේශීය සභාවක් හැටියට අතුරු ව්‍යස්ථාවලින් සම්මත කරලා දීලා තියෙනවා. ඒ සම්මත කිරීම් තුළ පළාත් සභාතුල හිටපු අමාත්‍යවරු එතකොට අපේ ආණ්ඩුකාරවරු කරුණු පැහැදිලි කරලා තියෙනවා. ඉතින් විශේෂයෙන්ම මේ නිවාස දේපල සංවර්ධනය, ඉඩම් කට්ටි කර විකිණීම පිලිබද මං දකින්නෙ සභාව ඇතුලෙ රහට දුවන කැල්ලක් වගේ තමයි.මේකෙ අපිට පළාත් සභාව මඟින් ප්‍රාදේශීය සභාවට 1988 පෙබරවාරි 04 වෙනිදා 1036 අංකය යටතේ අපිට මේ පිලිබඳ කරුණු පැහැදිලි කරලා තියෙනවා.ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයකින් මේ තොරතුරු ටික ලබා දීලා තියෙනවා. 6 වෙනි කරුණ යටතේ.ඉතින් අපේ සභාපතිතුමනි, මේකට 2003 වසරෙදි 11 වෙනි මාසෙ 28 වෙනිදා ගැසට් පත්‍රයකින් අතුරු ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරලා හරියටම කළ යුතු දේවල් අපිට පෙන්නුම් කරලා තියෙනවා.දැන් ඔබතුමා මෙතනදි මේ කරන්න හදන්නෙ මේකට ඔබතුමා කීපදෙනෙක් නම් කර ගෙනත් තියෙනවා.ඔබතුමයි, අපේ ලේකම්තුමියයි නිලධාරීන් හෝ හෝ කියලා දාලා තියෙනවා.එතකොට එක්කෙනෙක් තමයි එතෙන්ට සම්බන්ධ. ඔක්කොමලා සම්බන්ධ වෙන්නෙ නෑ නෙ.හෝ හෝ ගාලා දැම්මහම. එතකොට මේකෙ 4 දෙනෙක් ගෙන් යුතු කණ්ඩායමක් තමා ඔබතුමා පත්කරගෙන තියෙන්නෙ.ඔබතුමා මේ පත් කරගෙන තියෙන කට්ටි කරන, කැළි කරන ඉඩම් මං හිතන්නෙ ඔබතුමා යටතට ගන්න හදන එකක් තමා මේ යෝජනාවෙ අපි දකින්නෙ. ඉතින් ඒ නිසා මම මේ අතුරු ව්‍යවස්ථාව අරගෙන බලපුවාම සභාපතිතුමනි, මේකෙ තියනවා.ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයයි, උපසභාපතිවරයා, ඊට පස්සෙ මන්ත්‍රී මණ්ඩලය හැම පක්ෂයක්ම නියෝජනය වෙන විදිහට සහ ලේකම්තුමිය ඇතුළු කරගත්තු

කණ්ඩායමක් විසින් මේ ඉඩම් කට්ටි කිරීම, විකිණීම, මිළදී ගැනීම සභාවක් තුල කරන්න කියලා අපිට දැනුම් දීලා තියෙනවා. ඉතින් මම ඔබතුමා මේ කරන්න හදන කාරණාව ඔබතුමාගෙ උපසභාපතිතුමාත් අයින් කරලා ඔබතුමාට කැමතියි කියලා හිතෙන නිලධාරී කීපදෙනෙක් දාගෙන ඔබතුමා මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න.මේකෙදි ඔබතුමා ලෑස්ති වෙන්නෙ රාජ්‍ය නිලධාරීන් යොදාගෙන ඔබතුමා මේ ලෑස්ති වෙන්නෙ. අපි නැති කාලේ කොමසාරිස් පාලනය තියෙන කාලෙදි නිලධාරීන් දාගෙන පාලනය කරගෙන යන්න පුළුවන්.අපි මේ අවුරුදු 4 කට පත් කරලා ඇවිල්ලා තියෙනවා අපේ මන්ත්‍රී කණ්ඩායම.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

ඔබතුමා මට පැහැදිලි කරන්න. අන්තිමට මේ ඉඩම් කට්ටි කිරීම ගැන ඇවිල්ලා තියෙන චක්‍රලේඛය තමයි 2015 අගෝස්තු 28 වෙනිදා අති විශේෂ ගැසට් එක.ඔබතුමා අතේ ඒක තියෙනවද.ඒකෙ තියනවා. සෑම ප්‍රාදේශීය සභාවකම ඉඩම් කට්ටි කිරීම හෝ සංවර්ධනය කිරීම පිලිබඳව තීරණ ගැනීම පිණිස නිශ්චල සහ නිවාස දේපල සංවර්ධනය කිරීමේ කමිටුවක් පිහිටවිය යුතුය. එය පහත සඳහන් අයවලුන්ගෙන් සමන්විත යුතුවේ.

1.පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා - කමිටුවේ සභාපති
2. පළාත් පාලන ආයතනයේ ලේකම් - කමිටුවේ ලේකම්
3. පළාත් පාලන ආයතනයේ කාර්මික නිලධාරිවරයෙක්- කමිටු සාමාජික
4.අදාළ බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක - කමිටු සාමාජික
5.ආදායම් පරීක්ෂක හෝ ප්‍රජා සංවර්ධන නිලධාරී හෝ ආදායම් ප්‍රවර්ධන නිලධාරී හෝ පරිසර නිලධාරී යන අයගෙන් එක් අයෙක් - කමිටු සාමාජික

මේ තියෙන්නෙ මන්ත්‍රිතුමා. මේ යෝජනාව ඇතුළෙ තියෙන්නෙ මේ චක්‍රලේඛයේ තියන එක.එතනින් එහා දෙයක් තියනවනම් ඔබතුමා කියන්න .ඉතිහාසයක් තියනවා තමයි ඉඩම් කට්ටි වලින් ගහලා, විදුලිය ගන්න බැරිව අපහසුතාවයට පත් වෙච්ච මිනිස්සු දැන් සභාවට එනවා.මම ඇවිල්ලා තවම එක ඉඩම් කට්ටි කිරීමකටවත් අත්සන් කලේ නෑ.පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මේ වෙනකොට අපි ඇවිල්ලා කිසිම ඉඩමකට අවසර දීලා නෑ. හැබැයි අපි එන්න පෙර කට්ටි කිරීමට ක්‍රියාමාර්ග ගත්ත ඒවා තියෙනවා.කොටොම්පිටිය අනිත් එක කුලියාපිටිය පාරේ තියන ඉඩම. කුලියාපිටිය පාරේ තියන ඉඩම කට්ටි කිරීම සඳහා අවසරය ගන්න ආවා. ෆයිල් එකේ බැලුවා විදුලි බල මණ්ඩලයට ගෙවිය යුතු මුදල් ගෙවලා තියනවද කියලා.ගෙවලා නෑ.ඒ නිසා අනුමැතිය දුන්නෙ නෑ.ඉඩම් කට්ටි කරනවා ඇති.නමුත් විකුණන්න බෑ. කිසි කෙනෙකුට අළෙවි කරන්න බෑ.හොරෙන් අලෙවිකරත් බලපත්‍ර හදන්න ගියාට පස්සෙ ගත්ත මිනිහා අමාරුවෙ වැටෙනවා. ඒ නිසා ඔබතුමාලා කියන්න ගිහිල්ලා අපි මේ ඉඩම් කට්ටි කිරීමට අවසර දීලා නෑ.ඒ නිසා සභාවට කොච්චර එනවද දවසකට මගෙ ඉඩමට විදුලිය ගන්න බෑ.මගෙ ඉඩමට වතුර නෑ කියාගෙන මිනිස්සු.ඒ නිසා අපේ කාලේ ඇතුලත අනීතිකව සල්ලි නෙමේ මොනවා උස්සන් ආවත් අනුමැතිය ගන්න හම්බ වෙන්නෙ නෑ.

<u>ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)</u>

ඔබතුමා කාරණාව පැහැදිලි කරා.ඔබතුමා කියන ආකාරයට අළුත් අතුරු ව්‍යවස්ථාවක් පනවගෙන මේ කාරණාව කරන්න යනවා කියන එකනෙ කමිටුවක් පත් කරගෙන.ඉතින් මම පෙර තිබුන කාරණාවයි මේ කාරණාවයි පිළිබඳ කතා කලේ. 9 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් ඒ කාරණාව සඳහා යොදා ගන්න කියලා අපිට අතුරු ව්‍යවස්ථාවෙ දැනුම් දීලා තිබුනා.ඉතින් ඒකට එහා ගිය කාරණාවක් ඔබතුමා මේ චක්‍රලේඛය හරහා සභාවට එවලා තියනවා කියලා දැනුම් දෙනවා.ඒ පිලිබඳව තමයි ඔබතුමා කතා කලේ.ඉතින් අපි මෙතනදි කථා කරන්නෙ ඔබතුමා තනිවම තමයි මෙතනදි තින්දු තීරණ ගන්නෙ.ඉතින් ඔබතුමා තනියම තීන්දු තිරණ ගනිද්දි මොන තීන්දුවක් ගනීද කියන එක තමයි මම හිතුවෙ.ඒ නිසා කොමසාරිස් පාලනය මේ තුල දකින නිසා තමයි මම මේ කාරණය කිව්වෙ.ඉතින් විනිවිදභාවයක් පිළිබඳවනෙ ඔබතුමාලා කතා කරගෙන ආවේ.විනිවිදභාවයක් මම මේ කාරණාව තුළ දකින්නෙ නෑ.ඒ නිසා මේ කාරණාව පිලිබද ඔබතුමා අත්තනෝමතිකව බලය අතට අරගෙන කරන්න හදන ක්‍රියාවක් විදිහට මේ කාරණාවෙදී පෞද්ගලිකව මම මේ කමිටුවට විරුද්ධතාවය ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී සී.පී.රංජිත් අබේපාල මහතා(ස්වාධීන)**

ගරු සභාපතිතුමනි මේ සම්බන්ධව වචනයක් කියන්න තියෙනවා.අපි ළඟත් තියෙන්නෙ 2003.11.28 ගහපු ගැසට් එක.ඒ හින්දා මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධව ඔය අතුරු ව්‍යවස්ථාව සභාගත කරන්න කියලා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.එච්.රංජිත් උපාලි මහතා පෙ.ව.10.35 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි, 2023.11.28 මධ්‍යම රජයෙන් මේ ගැසට් නිවේදනය නිකුත් කරලා තියෙන්නෙ.ඒකෙ කියලා තියෙනවා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 ට අනුව මේ වගන්තියෙ ප්‍රාදේශීය සභාවට බලය පවරගන්න පුළුවන්.ප්‍රාදේශීය සභාවට බලය පවරනවනම් සභාපතිතුමා විතරක් මේ කමිටුවේ ඇයි.සභාවේ පක්ෂ විපක්ෂ ගණනාවක් තියනවා. සභාපතිතුමා එක පක්ෂයක් මේ සභාවෙ නියෝජනය කරන්නෙ.මං මේ ඉල්ලීමක් කරන්නෙ.මේකෙ පක්ෂ වලින් එක එක මන්ත්‍රීතුමාලා සම්බන්ධ කරගෙන අඩුගානෙ 9 දෙනෙක්වත් නම් කරගෙන ඔත්තෙ සංඛ්‍යාවක් ඉන්න ඕන මේ කමිටුවට. 9 දෙනෙක් සම්බන්ධ කරගෙන මේ කමිටුව පනතට අනුව ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

මේ චක්‍රලේඛයට අනුව අපි නම් කරලා තියෙනවා.ඔබතුමිය අකමැති නම් ඒක ප්‍රකාශ කරන්න.

**ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

මම මේ කමිටුවට විරුද්ධතාවය ප්‍රකාශ කරනවා කියලා වාර්තා ගත කරන්න.

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමා. පොඩි අදහසක් දක්වන්න කථා කලේ.විශේෂයෙන්ම ඉඩම් කට්ටි කිරීම පිලිබඳ යෝජනාවෙදි. විශේෂයෙන්ම දිවුල්වැව මංසන්ධියෙ අපේ සමූපකාරේ ඉස්සරහ ඉඩම. ගිරාතලාන හංදියෙ මං දැක්කා බැනර් එකක් දාලා තියෙනවා.රු.10,000.00 ක් ගෙවා ඉඩම වෙන් කරගන්න කියලා.ඔබතුමා කිව්වනෙ ඒක නීත්‍යානුකූල නෑ කියලා.නමුත් ජනතාව දන්නෙ නෑනෙ.ඒක නීත්‍යානුකූලද නැද්ද කියන එක.සබාවට හෝ අපට වගකීමක් තියෙනවා.ඒ දාලා තියෙන බැනර් එක ඉවත් කරන්න. ඔබතුමා කියනකම් අපි දන්නෙ නෑ ඔබතුමා අත්සන් කරලා නෑ කියලා.ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්න .

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

අනිවාර්යෙන් මන්ත්‍රීතුමා අපි ඒ සම්බන්ධව හොයලා බලලා.අපි නිලධාරීන්ට දැනුම් දෙනවා.අපේ අනුමැතියක් නැතිව ඉඩම් කට්ටි කරන එක වහාම නතර කරන්න.

**ගරු මන්ත්‍රී ඒ.ජී.ඩී. රංජිත් ප්‍රේමලාල් මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා ගිය සභා වාරෙකත් මං කතා කරා. ඔබතුමා අද මේ ඉඩම් කට්ටි කිරීම පිලිබඳ කථා කල නිසා මං නැවතත් නැවතත් කියන්නෙ.කොටොම්පිටියෙ තියනවා ඉඩමක් අනීතිකව තමා කටයුතු කරලා තියෙන්නෙ.මේ වෙනකොට ඉඩම් කැලි මිලදී අරගෙන තියනවා.මේ පිලිබඳ මං ඔබතුමාට සභාවාර 3 කට 4 කට කලින් කිව්වා හොයලා බලන්න කියලා.මේකෙ ඉඩම් මිලදී ගන්නෙ අහිංසක මිනිස්සු.බොහොම අමාරුවෙන්. ණයක් හරි අරගෙන.ඒ ඉඩම මිළදී අරගෙන ඒ ගත්තට පස්සෙ ඒ අවශ්‍ය පහසුකම් ටික දෙන්න සභාවෙ අනුමැතිය නෑ කියලා ඒ මනුස්සයට අසාධාරණය කරනවට වඩා.මං හිතනවා ඒ කැබලි කරන කෙනා එයාව සභාවට ගෙන්නගෙන අපිට එන ආදායමත් අපිට සභාවට අරගෙන ඒ දේ කරන එකද වටින්නෙ.නැත්තම් කවදාහරි අපෙන් මේක නීත්‍යානුකූලව අරගෙන නෑ කියලා ඒ මහජනතාව අපහසුතාවයට පත් කරන එකද හොද.ඒ නිසා මං ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

මන්ත්‍රීතුමා අපි ඒ පිලිබඳ හොයලා බැලුවා.නතර කරලා තියෙන්නෙ.මේක කළින් පටන් අරන් තිබුනෙ.ඔබතුමා කියන එකේ දෙපැත්තක් තියනවා.අවසර දුන්නැති වුනාම මිනිස්සු හොරෙන් විකුණලා අපහසුතාවයට පත්වෙනවා.ඒක අපි පිලිගන්නවා.නමුත් නීත්‍යානුකූලව කටයුතු කරන තෙක් අපිට අනුමැතිය දෙන්න බැනෙ.ඒ නිසා නීතිය කඩන්න අපිට බෑ.නීතිය නොකඩා මිනිස්සුන්ව දැනුවත් කරන්න පුළුවන් තරම්.අපි බැනර් එකක් දාමු නීත්‍යානුකූලව අනුමැතියක් මෙතෙක් නොලබපු ඉඩමක් කියලා.

**ගරු මන්ත්‍රී ආර්.ඩී.එම්. ජයන්ත දිසානායක මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ගරු සභාපතිතුමා දැන් මේ අපි දැනුවත්ව තියෙන්නෙ 2003.11.28 චක්‍රලේඛය.මේ චක්‍රලේඛය සභාගත කරලා.ඊට පස්සෙ චක්‍රලේඛයත් එක්ක කමිටුව පත් කරමු.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

නෑ. එහෙම ඕනකමක් නෑ.මේ චක්‍රලේඛයෙන් පිට නම් කරලා නෑ.චක්‍රලේඛය සභාගත කරනවා.

**ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි, සභාවෙන් අවසරයි.ඉඩම් කට්ටි කිරීම සම්බන්ධව කතා කරපු එක ගැන නෝටිස් දානවනෙ ඉඩම් විකුණනවා කියලා.බැනර් එකක් ගහනවා.ඒකෙ යටින් ඒ ගොල්ලන්ට පබ්ලිෂ් කරන්න කියන්න පුළුවන් ඒ ගොල්ලන්ට සභාවේ අනුමැතිය යටතේ කියලා අනුමත අංකය ඒකෙ දාන්න කියන්න.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

අපි අනුමැතිය නැති ඉඩම් කට්ටි විකුණනවනම් එය තහනම් කිරීමේ බලය අපිට තියෙනවා.ඒ සඳහා ක්‍රියාමාර්ග අපිට ගන්න පුළුවන්.චක්‍රලේඛය අපේ තියන සමූහයට අපි දාන්නම්.

**ඒ අනුව ඉඩම් කට්ටි කිරීම හෝ සංවර්ධනය කිරීම පිලිබඳව තීරණ ගැනීම පිණිස නිශ්චල සහ නිවාස දේපල සංවර්ධනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**III. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). III දරණ යෝජනාව**

මීළඟට මා විසින් ඉදිරිපත් කරන යෝජනාව.ස්ථාවර තැන්පතුවක් ආයෝජනය කිරීම, පොළිය සමඟ නැවත අළුත් කිරීම හා කල්පිරුණු ස්ථාවර තැන්පතුව මුදල් කර ගැනීම සඳහා සහා අරමුදලට ලබා ගැනීම සම්බන්ධ තීරණ ගැනීමේ බලය මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව වෙත ලබා දීම සුදුසු බව යෝජනා කරනවා.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

මං මෙහෙම කියන්නෙ මේක සභාවාර දෙකක් ඇතුළත මුදල් කල් පිරෙන්න පුළුවන්.අපි තීරණ ගන්නකෙට කාලයක් යනවා. ඒ නිසා අර මුදල අපිට මුදල් කමිටුවෙම යෝජනා සම්මත කරගෙන ගේන එක සුදුසුයි කියලා .

**ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.උප සභාපතිතුමා ඇතුළු සියළුම සහෝදර මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගෙන් අවසරයි.ඒ වගේම ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මන්ඩලයේ සියළුදෙනාගෙන් අවසරයි.සභාපතිතුමා ගෙනාපු යෝජනාවට විරුද්ධව තමයි මං නැගී හිටියේ වචන කීපයක් කතා කරන්නට.අපි දැක්කා පහුගිය වකවානුවේදි දියීවා සුලිකුණාටුව හරහා එක්කෝටි හැත්තෑහයලක්ෂයක් මුදලක් සභාවට ආවා. ඔබතුමාලා අපිට එවලා තිබුනා විශේෂ මහ සභාවක් කැඳවලා අපෙන් අවසරය ගන්න ඒ මුදල් සභා අරමුදලට එකතු කරගන්න වැඩ කටයුතු කරන්න.අපි බොහොම සත්භාවයෙන් ඇවිල්ලා සභාපතිතුමනි මේ මුදල් ඔබතුමාලට අනුමත කරලා දුන්නා කිසිම පැකිළීමකින් තොරව.අපි ඒ මුදල් ලබා දෙන්න අනුමැතිය දුන්නෙ මොකද ගංවතුරෙන් හානි වෙච්ච මාර්ග ප්‍රතිසංස්කරණය කරන්න.අළුත්වැඩියා කරන්න.එහෙම නැත්තම් කැඩිච්ච ඒවා හදන්න.හැබැයි අපි දැක්කා ඒ කැඩිච්ච පාරවල් තියෙද්දි තම තමන්ට දේශපාලනය කරපු පුද්ගලයන් ඉලක්ක කරගෙන ඒ පාරවල් වලට බොරළු එහෙම නැත්තම් සංවර්ධන කටයුතු කළා.අපිට හැගෙනවා මේ ස්ථාවර තැන්පතු එකේ මුදලුත් අරන් නැවත වතාවක් ඒ වැඩේම කරන්නද හදන්නෙ දන්නෙ නෑ කියන එක අපිට හැගෙනවා.ඒ කියන්නෙ මම ඔබතුමා දාලා තියනවා මෙතන මම දැක්කා පාරවල් ගණනාවක් රු. ලක්ෂ 30,35,65 දාලා තියෙනවා.දෙමළදොරට ලක්ෂ 65 ක් නිකපිටියට දාලා තියෙනවා ලක්ෂ30 ක්.ගරු සභාපතිතුමනි මම ඔබතුමාට මතක් කරන්න ඕනි වතුර ගලලා දවස් 2 කට පස්සෙ ලේකම්තුමියට, TO මහත්තයට, ඔබතුමාට මතක් කරා නිකපිටිය පාර කියන්නෙ නිකවැරටියෙ ඉඳලා හෙට්ටිපොල නගරයට විශාල ආදායමක් උත්පාදනය කරන මාර්ගයක්. වැඩිම සතිපොළට ආදායමක් ගේන මාර්ගයක් තමයි නිකපිටිය මාර්ගය.අඩුම තරමින් බොරළු ඇටයක් දාන්න පුළුවන්කමක් වුනේ නෑ. දියීවා සුළි කුණාටුවට ආපු ප්‍රතිපාදන වලින්.හැබැයි මට හිතෙනවා මේ ස්ථාවර තැන්පතු මුදල් ඔබතුමා මේ නම්

කරපු මාර්ග වලට ආපහු අරගන්නද කියලා මං පුංචි සැකයක් තියනවා.පැහැදිලිවම.මොකද පරිපූරකය අනුමත කරලා දීලා දියීවා සුලි කුණාටුවට ආපු සල්ලි නැවත ඔබතුමාට ඕන ඕන විදිහට මං හිතන්නෙ මන්ත්‍රීවරුන්ගෙ කොට්ඨාශවලටත් ඒ පාරවල් හදන්න ඒ මුදල් ලැබිලා නැතිව ඇති.කනස්සල්ලෙන් ඉන්න මන්ත්‍රීවරු ඉන්නවා.නැතිව නෙමේ.ඒ නිසා මේකට අපිට එකඟතාවය දෙන්න බෑ.මොකද ඔබතුමා මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඔබතුමාට ඕන ඕන අය නම් කරගෙන ඔබතුමා කියන දේවල් කරන්න තමයි ඒ කමිටුවට දාලා තියෙන්නෙ.ඒ නිසා මේ තැන්පත් මුදල මේකට බැර කරනවට අපි දැඩි සේ විරුද්ධයි කියන එක මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරනවා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා.ඔබතුමා මේ අවස්ථාවේදී කාරණා 2 ක් ඉස්මතු කරපු නිසා මං මේක කියන්න ඕන.කොටින්ම කියනවනම් අපි මේ ස්ථාවර තැන්පතු එකක්වත් කඩලා සල්ලි ආපහු ගන්නෙ නම් නෑ.මොකද අපි සභාවෙ දැන් වැටුප් ගෙවන්න තියනවා 40% ක් මේ අවුරුද්දෙ.ඒ නිසා කඩලා මේ සල්ලි අරන් පාරවල් හදන්න ඒවට මේවට පාවිච්චි කරන්නෙ නෑ.ඒක පැහැදිලිවම කියනවා.දෙවනි කාරණාව මේක කල්පිරුණම පොළිය ගන්නවා.ඒ පොළිය ලක්ෂ 15ක් 20 ක් තමයි එන්නෙ.බොහෝ දුරට නැවත ස්ථාවර තැන්පතු ඇතුලෙ දාන එක තමයි වෙන්නෙ.මෙන්න මේ කාරණාව තමයි මේ මුදල් කමිටුවට ගන්නෙ.වෙන මොකක්වත් නෙමේ.ඒ නිසා පැහැදිලිවම කියන්න ඕන ස්ථාවර තැන්පතු කඩලා අපි පාරවල් හදන්නෙත් නෑ.දෙවැනියට ඔබතුමා කිව්වා ලක්ෂ 30,60 දාලා තියනවා කියලා. මං පැහැදිලි කිරීමක් කරන්නම්.මන්ත්‍රීතුමා පහුගිය ආණ්ඩුව කිලෝමීටර් ලක්ෂෙ ව්‍යාපෘති කියලා ඒබීසී දාලා අතරමග නතර කරලා විනාශ කරපු පාරවල් ටිකක් තියනවා.ඒක දේශපාලන ප්‍රොජෙක්ට් එකක්.කිලෝමීටර් ලක්ෂෙ ව්‍යාපෘති ඒ පාරවල්වල ඒබීසී දාලා දැන් එගොඩටත් නෑ.මෙගොඩටත් නෑ.මිනිස්සුන්ට යන්න එන්න බෑ.අන්න ඒ පාරවල් වලට ආර්ඩී එකෙන් කිව්වා අපේ මාර්ග සංවර්ධන ඇමතිතුමා මේ පාරවල් අයිති සභාවට සභාව මගින් මේවා හදාගන්න කියලා.ඒ නිසා අපි ගිය අවුරුද්දෙ කෝටි 5 ක් මුදල් ඉතුරුකරලා වැඩිපුර ආදායම් ලබලා ගත්ත මුදල් වලින් තමයි පරිපූරක ඇස්තමේන්තුවලින් වෙන් කරපු මුදල් තමයි මේ වෙන් කරලා තියෙන්නෙ.අපි ඉතුරු කරපු සල්ලි මේ වෙන් කරලා තියෙන්නෙ.එතකොට අපේ ඉලක්කෙ තමයි මේ අවුරුදු 2,3 ගතවෙනකොට එහෙම පාරවල් පඩුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පඩුවස්නුවර නැගෙනහිරත් පඩුවස්නුවර බටහිරත් පාරවල් 12 ක් තියනවා. මේ 12 වැඩි මුදලක් දාලා හදලා අවසන් කරන එක තමා අපේ ඉලක්කෙ.ඒ නිසා ලක්ෂ 20,10 පොඩි පොඩි කෑලි දාලා මේක ඉවර කරන්න බෑ. ඒ නිසා මේ පාරවල් ටික හදලා ඉවර කරන්න ඕන.ඒ නිසා ඒ ව්‍යාපෘතිය තමා මේ යන්නෙ.විරුද්ධ වෙනවනම් ඔබතුමාලා විරුද්ධ වෙන්න. ඒ නිසා අපි මේ අරන් තියෙන්නෙ මේ අවුරුද්දෙ අයවැයේ තියන මුදල් නෙමේ මේ අරන් තියෙන්නෙ.අපි ගිය අවුරුද්දෙ බොහොම අමාරුවෙන්, නාස්තිය අවම කරලා, වංචාව දූෂණය අවම කරලා ඉතුරු කරපු මුදල් පරිපූරක ඇස්තමේන්තු දාලා.

<u>ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>

ගරු සභාපතිතමාගෙන් අවසරයි.ඒ වගේම මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සියළුම දෙනාගෙන් හා ලේකම්තුමිය ප්‍රමුඛ කාර්ය මණ්ඩලයෙන් අවසරයි.මං ඔබතුමා කිව්ව කාරණා ඇතුලෙ පොඩි අවස්ථාවක් දෙන්න.මුදල් ආයෝජනය කරද්දි අපි මෙතෙක් ආයෝජනයක් රිනීව් කරද්දි හරි අළුත් ආයෝජනයක් කරද්දි හරි අපි කරපු පිලියෙළ සභාපතිතුමාගෙන් මං අහනවා.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

පිලියෙළ තමයි.සභාපතිතුමාගේ නිර්දේශ මත ගිහින් තියෙන්නෙ.මේ පාර තමයි මේ කමිටුවට දාලා තියෙන්නෙ.

<u>ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>

එතකොට නැවත මේක මහ සභාවට නැතිව මුදල් කමිටුවට ඉල්ලන්න එතන වෙනස් වෙච්ච කාරණාවක් නැනෙ.

<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>

මන්ත්‍රීතුමිය මේ ඉල්ලීම කරන්නෙ මහ සභා වාර දෙකක් අතරට මේක එන නිසා. කාලය කල්පහු වෙන නිසා.

<u>ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>

විශේෂයෙන්ම කෝටි 4 ක වගේ මුදලක් ආයෝජනය අද කල් පිරෙනවනම් මුදල් කමිටුව ඊළඟ සතියෙනම් තියෙන්නෙ මං හිතන්නෙ වටිනා මූල්‍යමය තීන්දුවක් තමයි කෝටි 4 ක් සතියක් රුපියලක් ආයෝජනයක්

නැතිව සතියක් තියනවට වඩා සභාපතිතුමා, ලේකම්තුමිය හා ඒ විෂයභාර නිලධාරීතුමිය එකතු වෙලා ඒක ආයෝජනය නිවැරදිව කරනවනම් ඒකෙ ගැටළුවක් නෑ.කෝටේෂන් 3 ක් අරගෙන.මුදල් කමිටුව අපි දැන් දවස් 15 න් 15 ට තියෙන්නෙ.දවස් 15 ක් කෝටි 4ක් රුපියලක් ආදායමක් නැතිව ගිණුමෙ තියෙනවට වඩා ආයෝජනය කරන එක තමා සුදුසු.මට තිබුන ගැටළුව මුදල් කමිටුවෙන් අපි ඒ තීරණය ගනිද්දිත් නැවත ඇයි මේ මහ සභාවට දාලා ඇයි අනුමැතිය ඉල්ලන්නෙ කියන එක.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඒ වුනාට විනිවිද භාවයක් තියෙන්න ඕන මන්ත්‍රීතුමිය.අපි කමිටුවට ඉක්මනට දාලා.ඒ තීරණය ගමු.එතකොට ගැටළුවක් නැනෙ.ඔබතුමිය අහන එක හොඳයි.මහා සභාවෙන්ම මේකෙ අනුමැතිය ගන්න එක හොඳයිනෙ.ඔබතුමාලා ඔබතුමියලා ඉල්ලන්නෙ ඕකනෙ.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

තව එක කාරනාවක් තියෙනවා.එකක් ජංගම සේවය. කාරුණික ඉල්ලීමක් කරනවා.ජංගම සේවයක් කරනවනම් ඒකෙ අවසානය වෙනකම් කරන්න කියන එක.මොකද මම පෙත්සමක් මේ සභාවෙ ඉදිරිපත් කළා මූණමල්දෙණිය විහාරස්ථානයේ මිනිස්සුන්ගෙ කාලය, ශ්‍රමය,කුසගින්න ඉස්සරහා දවසෙ ෆාස්ටින් හිටපු කෙනා උදේ 10 ට ලේ දීපු.එයාගෙ වාර්තාවත් අද නෑ.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

මන්ත්‍රීතුමිය මං ඔබතුමියට පැහැදිලි කරන්නම්.මං එදත් ඔබතුමියට පැහැදිලි කරා.මං විමර්ශණයක් කරා එම්ඕඑච් එකෙන්.එතුමන්ලා කියන්නෙ පරීක්ෂණයට භාජනය කරන්නෙ ක්ෂණිකව ආපදාවට ලක් වෙන්න තියන දේවල් නෙමේ.සීනි වගේ දේවල් නෙමේ බලන්නෙ.මේ බලන්නෙ ඇත්තටම ඒ ගොල්ලො ළග නිදන්ගත රෝග දීර්ඝ කාලීන රෝග තියනවද කියලා.එහෙම තියන අය ඉන්නවනම් ටක් ගාලා වෙනම ඒ ගොල්ලන්ට දැනුම් දෙනවා.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

එහෙමනම් මං සංතෝෂ වෙනවා. මූණමල්දෙණිය වසමේ වකුගඩු රෝගීන් නෑ.ෂුගර් තියන අය නෑ.කොලෙස්ටරෝල් නෑ.හැබැයි අහිංසක මිනිස්සු ඒක දන්නෙ නෑ.සභාපතිතුමා.මමත් දැනුවත් කරා මේ සායනයට එන්න කියලා.ප්‍රතිපලයක් නැති දේවල් කරන්න එපා මින් ඉදිරියටවත්.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා</u>**

ඔබතුමියගෙ ප්‍රකාශයත් එක්ක මං සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට දැනුම් දෙන්නම්.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සඳ්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

අනිත් එක තමා සමාජ මාධ්‍ය භාවිතය ගැන. ඒකෙ මගෙ නම කිව්ව නිසා අවසර දෙන්න මේ පිලිබඳ කියන්න.මගේ ප්‍රකාශයක් සමාජ මාධ්‍යතුල මං නිකුත් කරලා තිබුනා තමයි.හැබැයි මට විතරද ඒකෙ තහනම.සමාවෙන්න නම කියනවට සංජීව කරුණා සාගර කියන ෆේස් බුක් නාමයෙන් 21 වෙනිදා පෝස්ට් එකක් ඉහූ වෙනවා සමුපකාරෙ ඡන්දෙ තියෙන්නෙ හෙට කියලා.මං හිතනවා ඒක ඡන්දය ඉලක්ක කරගෙන කිව්වද, දැනුවත් වෙලා කිව්වද, ඇත්ත කිව්වද, කියලා දන්නෙ නෑ.මෙහෙම එකක් තියනවා.පඬුවස්නුවර සමූපකාරයේ ලක්ෂ ගණනක කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය පාරිභෝගික අධිකාරිය සීල් තියයි.මේක නීත්‍යානුකූලව දැනගෙන කිව්වද? මං නිකුත් කරපු ප්‍රකාශෙ තුල එක බොරුවක් තියනවනම් එක වැරදි දෙයක් මම කිව්වා නම් මං සියල්ල කිව්වෙ මේ වාර්තා ටික පදනම් කරගෙන.මේ කොළවල නැති කිසිම දෙයක් මං කිව්වෙ නෑ.ඒ නිසා මං එහෙම අසත්‍ය දෙයක් කියලා තියෙනවනම් මට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරන්න.ඒක මට විතරක් නෙමේ. ඔබතුමත් කරලා තියනවා.මාත් කරලා තියනවා.ඔබත් කරලා ඇති.අනිත් එක තමයි කිලෝමීටරේ පාර .ඇත්තටම මට ඒක අදාල නිසා මං ඒක කියන්නෙ.මගෙ කොට්ඨාශෙ ඉතාම සතුටු වෙනවා ලක්ෂ 65 ක් වෙන් කරලා තියෙනවා මීදාවැව මාර්ගය ප්‍රතිසංස්කරණය කරන්න.හැබැයි ඒකෙදි මගෙ කොට්ඨාශෙ හාතිහාරේ පාර කිලෝමීටරේ කාපට් එක දැම්මා.ඉතාම සාර්ථකයි. ඉතාමත් වටිනවා මොකද ඇඹෝගෙදර කාපට් එකෙන් පොඩි ප්‍රමාණයක් ඇරලා නැවත ඒ කාපට් එකෙන් කිලෝමීටරේ ඉවර කරලා තියනවා.හැබැයි මීදාවැව මාර්ගය එක්කෝටි අනුහත් ලක්ෂ තිස්පන්දාහක ඇස්තමේන්තුව ආර්ඩී එකේ ඉංජිනේරු මහත්තයගෙ ඇස්තමේන්තුවට වැඩ පටන් ගත්තා.ඉතාම සාර්ථකව බේස් ඒකත් හදලා තිබ්බා.ඒ කරපු වැඩ වල මං හිතනවා හරිම අධීක්ෂණය කරලා තමයි මුදල් ලැබුනෙ.හැබැයි අවසාන අදියරට රුපියලක මුදලක්වත් ඒ කරපු මහත්තයට හම්බ වුනේ නෑ.අනිත් එක තමයි ඒ පාරේ ඒ කරන කාලය තුල කිසියම් ගැටළුවක් තිබුනෙ නෑ.බේස් එක හොදට හදලා, කාපට් එකට ඒබීසී අතුරලා ගම් එකත් ගහලා කාපට් එක ගහන්න සතියක් තියෙද්දි මුදල් වියදම් කරලා

කරපු අරගලය කියන විනාශයත් එක්ක ඒ පාර එතනින් නතර වුනා. දවස් 5 ක් තිබුනනම් ඒ පාරත් හාතිහාරෙ පාර වගේ කාපට් එක එලන්න විතරමයි තිබුනෙ.මම කණගාටු වෙනවා ඔබතුමා කිව්ව එක ගැන.

**ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

අපි ඇත්තටම මේ යෝජනාව සභාවට දැම්මනෙ සභාපතිතුමා. අපි නැවත නැවත කාරක සභා පත් කර ගැනිමේ යෝජනා වසරක් පාසා මහ සභාවට ඉදිරිපත් කරනවා.ඒවා එහෙම ඉදිරිපත් කරන්න ඕන.ඒ වුනාට මේ වගේ යෝජනා වසරක් පාසා මං හිතන්නෙ ඉදිරිපත් කරන්න ඕන නෑ කියලා.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

මන්ත්‍රීතුමිය ඔය යෝජනාව මීට පෙර මහ සභාවට දාලා නෑ.

**ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

එහෙම නම් පහුගිය වසරවල වැඩ කටයුතු කලේ කොහොමද.මේවා මුදල් සම්බන්ධ කාරණා.මොනාහරි ප්‍රශ්නයක් වුනොත් අපි ඔක්කොටම අධිහාර වෙනවා. ඒ හින්දා මේවා විනිවිදභාවයෙන් කටයුතු කරන්න මොනවාහරි වෙනස් කරනවනම් සභාපතිතුමා ඒක වෙනස් කරන්න ඕන බොහොම හිතලා මතලා.එහෙම අවශ්‍ය නොවෙනවනම් මේවා බොරුවට සභාවට දාලා අපේ කාලේ නාස්ති කරන්න එපා.අපි ඔක්කොටම අධිහාර කරන්න එපා.

**ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමා, උපසභාපතිතුමා ප්‍රධාන මන්ත්‍රී මණ්ඩලයෙන්, ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.දැන් ඔබතුමා කිව්වා පහුගිය කාල වකවාණුවේ කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීමේ කාර්ය සිද්ධ කළා කියලා.මගේ කොළඹගම කොට්ඨාශයේ පාරවල් කීපයකුත් කාපට් දැම්මා ඒවා නිම කරන්න හැකියාව ලැබුනා.මේකෙ 18 වෙනි යෝජනාව යටතේ පාත මුල්ල ගම මැද මාර්ගය පිවිසුම අළුත්වැඩියාව සඳහා ඒකට ලක්ෂ 30ක් වෙන් කරලා තියනවා.හැබැයි මේක ලක්ෂෙ ගොඩේ තිබුන පාරක් නෙමේ.යහපාලන ආණ්ඩුව කාලෙ තාර දාපු පාරක්. ඒකෙ පිවිසුම තමා දැන් ඩැමේජ් වෙලා තියෙන්නෙ.මේ යෝජනා 12 ක් විතර තියෙන්නෙ ඒ ලක්ෂෙ ගොඩේ තිබුන ඒවා කිව්වනෙ.ඒ ලක්ෂෙ ගොඩේ තියන පාරක් නෙමේ මේක.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

ඕකෙ වර්ග දෙකක් තියනවා මන්ත්‍රීතුමිය.එකක් තමයි අළුතින් හදන පාරවල්.දෙවැනි එක තමයි තාරදාලා තියන පාරවල් නැවත අළුත්වැඩියාව

**ඒ අනුව ස්ථාවර තැන්පතුවක් ආයෝජනය කිරීම, පොළිය සමඟ නැවත අළුත් කිරීම හා කල්පිරුණු ස්ථාවර තැන්පතුව මුදල් කර ගැනීම සඳහා සහා අරමුදලට ලබා ගැනීම සම්බන්ධ තීරණ ගැනීමේ බලය මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව වෙත ලබා දීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**IV. ගරු උපසභාපති බන්දුල සමරවික්‍රම මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). IV දරණ යෝජනාව**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,ජලය,විදුලිය,දුරකථන සහ ව්‍යවස්ථාපිත ගෙවීම් මෙන්ම වැටුප් හා දීමනා ගෙවීම අනුමත කිරීමේ බලය මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා වෙත 2025.06.30 දින සහ ඊට සංශෝධනයක් වශයෙන් 2026.01.06 දින මහ සභාවේ පැවරු බලයට අමතරව බලය පැවරීම සුදුසු බව මේ සභාවට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ජී.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු උප සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී පී.එම්. කුමාරසේන ජයලත් මහතා - ( ස.ජ.බ)**

සභාපතිතුමා ඒ පිලිබඳ පැහැදිලි කිරීමක් කරනවද?

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා**

දැන් ඔබතුමාලා මෙතන කිව්ව නිසා මං පැහැදිලි කිරීමක් කරන්නම්.සභාවේ රියදුරු හිඟයි.ඒ අදාල අනුයුක්ත කිරීම් සභාවේ සභාපතිවරු කරලා තියනවා. මේකෙ රියදුරෝ 4 දෙනයි ඉන්නෙ.අනිත් අය

ඔක්කොම මාර්ග කම්කරු, ක්ෂේත්‍ර කම්කරු, සෞඛ්‍ය කම්කරු අය තමයි.මේකෙන් ඉල්ලලා තියෙන්නෙ සෞඛ්‍ය කම්කරු කෙනෙක් අරන් එයාට රියදුරු වැටුප ගෙවන්න නෙමෙයි.එහෙම ගෙවන්න බෑ.හැබැයි ගෙවීම. ගෙවීම කොහොමමත් අපි මහ සභාවේ අනුමැතියට යටත්ව තමයි මේක ගෙවන්නෙ.මේ සභාවට දාන්නෙ මෙච්චර කල් අනුමැතියක් අරගෙන නෙමේ ගෙවලා තියෙන්නෙ.ඒ නිසා දැන්වත්.මේවා ක්‍රමවත් තැනකට ගන්න ඕන.ඒ නිසා තමයි මේ සභාවට දාලා අනුමැතිය අරගෙන ඒකට අදාල කරන ක්‍රියාමාර්ග ගන්නෙ.ඔබතුමාලට සැකයක් ඇති කලින් එහෙම ගියාට දැන් ඇයි යන්න බැරි කියලා.එහෙම යන්න බෑ.සමහර ඒවා ක්‍රමවත් කරගන්න ඕනෑකම තියෙනවා.ඒ නිසා තමයි මේ යෝජනාව සම්මත කරගන්නෙ.ඒ හින්දා ඔබතුමාලා බය වෙන්න එපා.අනීතිකව අපි කිසි දෙයක් කරන්නෙ නෑ.

**ඒ අනුව ජලය,විදුලිය,දුරකථන සහ ව්‍යවස්ථාපිත ගෙවීම් මෙන්ම වැටුප් හා දීමනා ගෙවීම අනුමත කිරීමේ බලය මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගරු සභාපති වයි.ජී. සංජීව කරුණාසාගර මහතා වෙත 2025.06.30 දින සහ ඊට සංශෝධනයක් වශයෙන් 2026.01.06 දින මහ සභාවේ පැවරූ බලයට අමතරව බලය පැවරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

තේ පානය සඳහා සභාව අඩාලව කල් තියන්න යෝජනා සම්මත කරගන්න.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

තේ පානය සඳහා විනාඩි 15 කට අඩාලව කල් තැබීම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පෙ.ව 11.10 ටතේ පානය සඳහා විනාඩි 20 ක් සඳහා සභාව කල් තබන ලදි.**

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

අඩාලව කල් තැබූ සභාව නැවත ආරම්භ කිරීම සඳහා යෝජනා සම්මත කරන්න.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

තේ පානය සඳහා අඩාලව කල් තැබූ සභාව නැවත පවත්වා ගෙන යාම සුදුසුයි කියා මම යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)</u>**

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව තේ පානයෙන් පසු මහ සභාව 11.30 ට නැවත ආරම්භ විය**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ඒ.පී.තරංග චම්පික අලහකෝන් මහතා පෙ.ව.11.31 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා

**V. <u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).Vදරණ යෝජනාව</u>**

පඬුවස්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උග්‍ර අඩු බරැති ළමුන් 10 දෙනෙකු (පඬුවස්නුවර නැගෙනහිර හා බටහිර සෞඛ්‍ය සේවා නිලධාරීන් මගින්) සඳහා මාස 8ක් පුරා පෝෂණ මල්ලක් ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.199,700.00ක් වැය දැරීමට යෝජනා කරනවා.

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)</u>**

ගරු සභාවෙන් අවසරයි.ඇත්තටම සභාපතිතුමනි අපි රටක් විදිහට ලෝකෙ ඉස්සරහට යනවනම් අපේ ඊළඟ පරම්පරාව ඉතාම ශක්තිමත්ව සහ සෞඛ්‍ය ආරක්ෂිතව ගොඩ නැගීම අත්‍යවශ්‍ය කාරණයක්.ඒ වෙනුවෙන් සභාවට කළ හැකි ප්‍රමාණය සීමිතයි. නමුත් ඒ ප්‍රමාණය හරි ඉතාමත් නීත්‍යාණුකූලව කිරීම අත්‍යවශයයි.මීන් ඉස්සරත් මේ වගේ කාරණා සිද්ධ වුනා.නමුත් මේ සභාවට මේක ඉදිරිපත් කරලා සභාවේ අනුමැතිය යටතේ සහ සභාවට දැනුම් දීලා කටයුතු කරන එක සුදුසුයි.ඒ අනුව මෙම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>

අපි මේක ගිය අවුරුද්දෙත් දුන්නා. ඇත්තටම මේ තෝරා ගැනීම කරලා එවන්නෙම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන්.එච්චට පස්සෙ තමයි අපි දන්නෙ කව්ද කියලා.ඇත්තටම අපිට හිතෙනවා මෙහෙම අම්මලා ඉන්නවද කියලා.ඒ සමහර අම්මලා හරිම කෙසඟයි.ඒ නිසාම තමයි ඒ දරුවන්ගෙ බර අඩු දරුවො බවට පත්වෙලා තියෙන්නෙ.ඒ නිසා අපි ගිය අවුරුද්දෙත් මාස 8 ක් පුරාවට මේ පෝෂණ මල්ල දුන්නා.අපි

මැද හරියෙදි ප්‍රගතිය ඇහුවා.ඒ ගොල්ලො කිව්වා දැන් බර වැඩි වේගන යනවා කියලා දරුවන්ගේ.අනාගතේ අපේ දරුවන්ට හදන්න ඕන රටේ පෝෂණය අඩුවෙන්න අඩුවෙන්න බුද්ධි ප්‍රමාණය අඩු වෙනවා.ඒ හින්දා පෝෂණය වැඩි කරලා හොඳ නිරෝගී දරුවො බවට පත් කරන්න ඕන.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ උග්‍ර අඩු බරැති ළමුන් 10 දෙනෙකු (පඩුවස්නුවර නැගෙනහිර හා බටහිර සෞඛ්‍ය සේවා නිලධාරීන් මගින්) සඳහා මාස 8ක් පුරා පෝෂණ මල්ලක් ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.199,700.00ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

<u>**VI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIදරණ යෝජනාව**</u>

ම විසින් ඉදිරිපත් කරන යෝජනාව.607-9-111 වැය ශිර්ෂය යටතේ කනෝයාය වසමේ දිරිය ගම්මාන වැඩසටහන පහත නිර්ණායක යටතේ සිදු කිරීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.500,000.00 ක් වැය දැරීමට යෝජනා කරමි.

607-9-111-i සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම රු.100,000.00
607-9-111-ii ස්වයං රැකියා වැඩසටහන් රු.60,000.00
607-9-111-iii තරුණ කෘෂි ආකර්ෂණීය වැඩසටහන් රු.150,000.00
607-9-111-ivකාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් රු.50,000.00
607-9-111-v වෙනත් වැඩසටහන් රු.140,000.00

<u>**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමා, ඇතුළු ගෞරවනීය සභාවෙන් අවසරයි.එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**</u>

අපි ගිය අවුරුද්දෙත් ඔය වැඩසටහන කලා ගම්මානයක් තෝරාගෙන දුනුපොත වසම තමයි තෝරාගෙන තිබුනෙ.ඒ ගම්මානෙ මේ වෙනකොට ක්‍රියාත්මක වෙමින් යනවා.ඇත්තමට දිරිය ගම්මානයක් බවට පත් කරන්න මේ මුදල ප්‍රමාණවත් නෑ. නමුත් සභාවක් ලෙස යම් තැනකට මේ ගම්මානෙ ගේන්න සමත් වුනා.ඒ නිසා අපි මේ සැරේ තොරගත්ත ගම්මානෙ සඳහා අනුමැතිය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**</u>

සභාපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඉතාම කාලෝචිතයි. පහුගිය 2025 වසරේ දිරිය ගම්මාන වැඩසටහන යටතේ දුනුපොත ගම තෝරා ගැනීමට කටයුතු සිද්ධ කළා.ඇත්තටම පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ගරු සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට සහ ගෞරවනීය සභාවට දුනුපොත ගමේ සියළුදෙනාගෙ පුදුමාකාර ප්‍රශංසාවක්,ඇගයීමක් තියෙන්නෙ.මොකද ඔවුන් හදුනාගෙන තිබුනෙ නෑ ප්‍රාදේශීය සභාවක් තුලින් මෙවැනි වැඩ කටයුත්තක් කෙරෙන බව.ඒ නිසා ඔවුන් ඉතාම තෘප්තියෙන්, ඉතාම ආසාවෙන් යුතුව මේ කටයුත්තට සම්බන්ධ වුනා.ඒ අවස්ථාව මේ වසරේ කනෝයාය වසමට ලැබිලා තියනවා. ඒ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක්

<u>**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**</u>

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රි මණ්ඩලය, ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු සභාපතිතුමනි ඇත්තටම මේ දිරිය ගම්මාන වැඩසටහන කිරිමැටියාව කොට්ඨාශයේ කනෝයාය වසමට ලබා දීම පිලිබඳව අපේ කමිටුවේ සභාපතිතුමා ඇතුළු සියළුදෙනාට ස්තුතිය පුද කරනවා.කිරිමැටියාව කොට්ඨාශයේ මේ කනෝයාය වසම කියන්නෙ ඉහල රඳව පහල රදව කියන ගම් දෙකම අයිතිවෙන වසමක්.ඉතාමත්ම දුෂ්කර වසමක් මං හිතන්නෙ.යන්න පාරවල්වත් හරියට නැති.දුෂ්කරව ජීවිතේ ගෙවන සාමාජිකයන් ප්‍රදේශවාසීන් පිරිසක් ජීවත්වන ප්‍රදේශයක්.ඒකට මේ අවස්ථාව ලබා දීම පිලිබදව කිරිමැටියාව කොට්ඨාශයේ මන්ත්‍රිවරයා වශයෙන් ස්තුතිවන්ත වෙනවා. මම මේ පිලිබඳව සියළු නිර්ණායකයන්ට යටත්ව අපි ආර්ථික සංවර්ධන නිලධාරීන් කැඳවගෙන සියළු යෝජනා මං සභාවට ඉදිරිපත් කළා.මේ යෝජනාව ගෙන ඒම පිලිබඳව ගරු සභාපතිතුමාටත් ප්‍රාදේශීය සභාවටත් මම ස්තුතිය පුද කරනවා.

**ඒ අනුව 607-9-111 වැය ශිර්ෂය යටතේ කනෝයාය වසමේ දිරිය ගම්මාන වැඩසටහන පහත නිර්ණායක යටතේ සිදු කිරීමටත් 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.500,000.00 ක් වැය දැරීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**VII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). VIIදරණ යෝජනාව**

607-9-V111 වැය ශිර්ෂය යටතේ නොදියුණු ගම්මාන හා දිලිදුකම තුරන් කිරීමේ සංවර්ධන වැඩසටහන පහළ ගොමුගොමුව වසමට අයත් කරඹේ ගමෙහි සිදු කිරීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.250,000.00 ක් වැය දැරීමට යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එන්.ඩබ්.ඒ.රංජිත් නවරත්න මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රි මණ්ඩලය, ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු උප සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

ගිය වසරෙත් මෙය ක්‍රියාත්මක වුනා.කරඹේ කියලා කියන්නෙ අපේ චාමින්ද දසනායක මන්ත්‍රිතුමාගේ වසමේ එතුමා අද නෑ.අපේ උපුල් නිශාන්ත මන්ත්‍රිතුමා ඉන්නවා.මේක අර දූපතක් වගේ ඒකේ මිනිස්සු ඉන්නවා.හැබැයි වටවෙලා තියෙන්නෙ.වෙනමම ඡන්ද මධ්‍යස්ථානයක්.මේක කුඩා ගම්මානයක්.ඒ නිසා යටිතල පහසුකම් බොහොම අඩු තැනක්.හොද යෝජනාවක්.මේක සම්මත කරගන්න.

**ඒ අනුව 607-9-V111 වැය ශිර්ෂය යටතේ නොදියුණු ගම්මාන හා දිලිදුකම තුරන් කිරීමේ සංවර්ධන වැඩසටහන පහළ ගොමුගොමුව වසමට අයත් කරඹේ ගමෙහි සිදු කිරීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.250,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**VIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).VIIIදරණ යෝජනාව**

මීළඟට 607-03-i වැය ශිර්ෂය යටතේ රු.500,000.00 ක මුදලක් වෛද්‍යආධාර සඳහා වෙන් කර ඇති බැවින් පහත නම් සදහන් අය සඳහා ආධාර ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

1. කටුමුළුව කනත්තේ වැව පදිංචි පී.ඒ.ඩී. දයා සරත් ආනන්ද - හෘද රෝගය රු.10,000.00
2. මඩිග පඩාව මංඩපොල පදිංචි ඊ.පී.ඩී.එස්.මානෙල් රාජපක්ෂ - පිලිකා රෝගය රු.10,000.00
3. පොල්ගහවෙල ප්‍රා.ස.අයත් හතලිස්පහුව ජනපය පෙර පාසල් පාලිකා පී.ජී.ආර්.සුභාෂිනී වික්‍රමරත්නගේ පාදයේ ආබාධ සඳහා ශල්‍යකර්මයට - තීරණය කරන ලද මුදලක්
4. මහව ප්‍රා.ස රියදුරු සේවයේ නියුතු ඩී.ඒ.එස්.පී.දික්වැල්ලගේ හෘද රෝගය - තීරණය කරන ලද මුදලක්

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මං හිතන්නෙ අපිට පුළුවන්කම ලැබුනා.අපේ රංජිත් උපාලි මහතාට රු.50,000.00 ක මුදලක් අනුමත කරලා ඒ මුදල භාර දෙන්න.ඒ වගේම අවට සභාවලිනුත් ඉල්ලීම් කරලා තියනවා එතුමට උදව් කරන්න කියලා.අපි බලාපොරොත්තු වෙනවා අපිට ඒ උදව් ලැබෙයි කියලා.මං විශේෂයෙන්ම අපේ සභාපතිවරුන්ටත් දැනුම් දෙනවා කරුණාකරලා ඉක්මනට අපිට අනුමත කරලා එවන්න කියලා.මේකෙ අපි සුභාෂිණී මහත්මියටත්, දික්වැල්ල මහතාටත් අවට ප්‍රාදේශිය සභාවල සේවය කරන අය.අපි මුදලක් තීරණය කරලා අනුමත කර ගමු.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රි මණ්ඩලය, ලේකම්තුමිය ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් අවසරයි.ගරු සභාපතිතුමනි,පළමු යෝජනා දෙකේ මුදලක් තීරණය කරලා තියනවා. 3,සහ 4 යෝජනා සඳහා තීරණය කරන මුදලක් කියලා තමා තියෙන්නෙ.මම හිතනවා එකක් පාදයේ ශල්‍යකර්මයක්,අනික හෘද රෝගය පිලිබඳ අවශ්‍යතාවයකට තමා. හෘද රෝගයට සැලකිය යුතු මුදලක් වැය වෙනවා. පාදයේ ශල්‍යකර්මයටත්

සැලකිය යුතු මුදලක් අවශ්‍ය වෙයි කියලා හිතෙනවා.මේ කව්රු වුනත් කොහේ සේවය කරත් අපේ රටේ පුරවැසියො.ඒ පුරවැසියන්ට අපිට සභාවක් හැටියට යම්කිසි උදව්වක් කරන්න පුළුවන් නම් වටිනවා.ඒ නිසා මං හිතනවා අවම වශයෙන් රු.20,000 ක් 25,000 ක් මුදලක්වත් අපි මේ 3,4 සඳහා ලබා දීම සුදුසුයි කියලා. ඒ අනුව එක් අයකු වෙනුවෙන් රු.25,000 ක මුදලක් ලබා දීම සුදුසුයි කියලා මං යෝජනා කරනවා.

<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව 607-03-i වැය ශිර්ෂය යටතේ රු.500,000.00 ක මුදලක් වෛද්‍යආධාර සඳහා වෙන් කර ඇති බැවින්**

1. **කටුමුළුව කනත්තේ වැව පදිංචි පී.ජී.ඩී. දයා සරත් ආනන්ද - හෘද රෝගය රු.10,000.00**
2. **මඩිග පඩාව මංඩපොල පදිංචි ර්.පී.ඩී.එස්.මානෙල් රාජපක්ෂ - පිළිකා රෝගය රු.10,000.00**
3. **පොල්ගහවෙල ප්‍රා.ස.අයත් හතලිස්පහුව ජනපය පෙර පාසල් පාලිකා පී.ජී.ආර්.සුභාෂිනී වික්‍රමරත්නගේ පාදයේ ආබාධ සඳහා ශල්‍යකර්මයට - රු.25,000.00**
4. **මහව ප්‍රා.ස රියදුරු සේවයේ නියුතු ඩී.ජී.එස්.පී.දික්වැල්ලගේ හෘද රෝගය - රු.25,000.00**

**වෛද්‍ය ආධාර ලබා දීමට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

<u>X. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).IX.දරණ යෝජනාව</u>

පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ 2025 අ.පො.ස.සාමාන්‍යපෙළ විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගත් අඩුආදායම්ලාභී පවුල්වල දරුවන් 20 දෙනෙකු කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල දෙක මගින් හඳුනාගෙන එක් දරුවෙකු සඳහා රු.10,000.00 බැගින් මුදල් පරිත්‍යාග වශයෙන් ලබා දීමේ අධ්‍යාපනික අභිප්‍රේරණ වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.200,000.00 ක් වැය දැරීමට යෝජනා කරමි.

<u>ගරු මන්ත්‍රීනී ර්.ඒ. ඉරාෂි ප්‍රියදර්ශනී මහත්මිය - (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා ඇතුළු මහ සභාවෙන් අවසරයි.ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ 2025 අ.පො.ස.සාමාන්‍යපෙළ විභාගයෙන් විශිෂ්ඨ ප්‍රතිඵල ලබාගත් අඩුආදායම්ලාභී පවුල්වල දරුවන් 20 දෙනෙකු කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල දෙක මගින් හඳුනාගෙන එක් දරුවෙකු සඳහා රු.10,000.00 බැගින් මුදල් පරිත්‍යාග වශයෙන් ලබා දීමේ අධ්‍යාපනික අභිප්‍රේරණ වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඔ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.200,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

<u>X. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).Xදරණ යෝජනාව</u>

මා විසින් ඉදිරිපත් කරන යෝජනාව.පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 22 න් එක් ජ්‍යේෂ්ඨපුරවැසියා බැගින් 22 කු තෝරා ඔවුන් ඇගයීමේ හා ප්‍රාසාංගික වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.100,000.00 ක් වැය දැරීමට යෝජනා කරනවා.මේ වැඩසටහන ගියවරත් අපිට කරගන්න පුළුවන්කම් ලැබුනා.එනිසා මෙවරත් සාර්ථක ලෙස මෙය කරගන්න ඕනකම තියෙනවා.යෝජනාව මා ඉදිරිපත් කරනවා.

<u>ගරු මන්ත්‍රී බී. සුදත් උදය කුමාර මහතා- (ජා.ජ.බ)</u>

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 22 න් එක් ජ්‍යේෂ්ඨපුරවැසියා බැගින් 22 කු තෝරා ඔවුන් ඇගයීමේ හා ප්‍රාසාංගික වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය**

**ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.100,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**XI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XI දරණ යෝජනාව**

පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඉගනුම ලබන පඬුවස්නුවර කනිෂ්ඨ විද්‍යාලයේ විශේෂ අවශ්‍යතා ඉගනුම් ඒකකයේ සෙල්ලම් මිදූලට අවශ්‍ය උපකරණ ලබා දීමේ වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.100,000.00 ක් වැය දැරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

විශේෂ අවශ්‍යතා ඇති දරුවො කව්ද කියලා අපි දන්නවා. අඩු බර සහතව ඉපදිච්ච, විවිධ ආබාධ ඇති දරුවො.හැම පාසලකටම ඒකට ඉඩකඩ විවර වෙලා නෑ.පාසල් කීපයක් තියෙන්නෙ.පඬුවස්නුවර කනිෂ්ඨ විද්‍යාලය තොරාගෙන තියෙනවා.මගෙ යෝජනාව ඉදිරිපත් කරනවා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ඉගනුම ලබන පඬුවස්නුවර කනිෂ්ඨ විද්‍යාලයේ විශේෂ අවශ්‍යතා ඉගනුම් ඒකකයේ සෙල්ලම් මිදූලට අවශ්‍ය උපකරණ ලබා දීමේ වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.100,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**XII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XII.දරණ යෝජනාව**

පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ක්‍රියාන්විතයේ යෙදී සිටියදී මිය ගිය අතුරුදහන් හා ආබාධිත වූ රණවිරුවන්ට උපහාර පිදීමේ හා ඔවුන් ඇගයීම සඳහා වූ සංගීතමය රසවින්දනාත්මක වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.200,000.00 ක් වැය දැරීමට යෝජනා කරමි.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මේ වැඩසටහන අපි සාර්ථකව සිද්ධ කලා.පක්ෂ විපක්ෂ මන්ත්‍රිවරු සියළුදෙනාම බහුතරයක් සම්බන්ධ වුනා.ඒ සම්බන්ධව ස්තුතිය ප්‍රකාශ කරමින් මෙවරත් සාර්ථක වැඩසටහනක් කිරීම සඳහා මං මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රීනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාපතිතුමනි.පුංචි අදහසක් එකතු කරන්නයි නැගිට්ටෙ.ක්‍රියාන්විතයේ යෙදී සිටියදී මිය ගිය හෝ ආබාධිත රණවිරුවන් සඳහානෙ මේ වැඩසටහන කරන්නෙ. ඇත්තටම ඔවුන් හරි අසරණයි මේ වෙලාවෙ. සාමාජිකයො පවුල්වල අසරණයි .මගෙ අදහස ඔවුන් වෙනුවෙන් රසවින්දනාත්මක සංගීත වැඩසටහනකට වඩා ඔවුන් වෙනුවෙන් බඩු මල්ලක් හෝ මුදලක් හෝ පරිත්‍යාගයක් කරනවනම් මීට වඩා හොඳයි කියලා මට හැගෙන අදහස මම කිව්වෙ.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

මේකෙ මියුෂිකල් ෂෝ එකක් නෙමේ.රසවින්දන වැඩසටහනක් කියන්නෙ වෙනම ගීතය අහලා ඒකෙ අර්ථ විමසුමක් කරන වැඩසටහනක්.මේක අධ්‍යාත්මික වැඩසටහනක්.අපිට අයවැයෙන් වෙන්කරලා තියන මුදල තමයි මේ.මීට වඩා මුදලක් වෙන්කරලා නෑ අයවැයෙන්.අපිට තව ස්වේච්ඡාදායකත්වයෙන් අපිට තව මොනවා හරි එක් කරගන්න පුළුවන්.ඒ නිසා එහෙම යෝජනා තියනවනම් අපි ඒකට එකතු කර ගමු.

ගරු සභාවෙන් අවසරයි.අපේ මන්ත්‍රී තුමිය කිව්ව කාරණයට පොඩි කාරණයක් කියන්නම්.ඔබතුමියගෙ අදහසට අපි ගරු කරනවා.නමුත් ඇත්තටම අපේ සභාපතිතුමා කිව්වා වගේ සිංදු කිය කිය බජව් දාන එකක් නෙමේ. තමාගේ පියතුමා,ඥාතියා අහිමිවුන අය තමයි මේ කියන තත්වයට ගොදුරු වෙලා තියෙන්නෙ.

එතකොට ඒක ඇතුලෙ ඒ අයගෙ කැපකිරීම කොතරම් අග්‍රගණ්‍යද ඒ ගොල්ලන්ගෙ දරු පරම්පරාව නැත්තම් ඒ ගොල්ලන්ගෙ පවුල් කොයිතරම් අභිමානයට ලක්වෙලා තියනවද කියන එකත් එකතුව තමයි මේ වැඩසටහන කරන්නෙ.ඒ නිසා මං හිතනවා ඒකෙන් විශාල සහනයක්, මානසික ශක්තියක් ඒ පවුල්වල අයට ලබාගන්න පුළුවන් වෙයි කියලා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ක්‍රියාන්විතයේ යෙදී සිටියදී මිය ගිය අතුරුදහන් හා ආබාධිත වූ රණවිරුවන්ට උපහාර පිදීමේ හා ඔවුන් ඇගයීම සඳහා වූ සංගීතමය රසවින්දනාත්මක වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.200,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>XIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XIIIදරණ යෝජනාව</u>**

පඩුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී තෝරාගත් එක් පෙර පාසලක සිසුන් වෙනුවෙන් සතියකට එක් දිනක් බැගින් මාස 5 ක් දිවා ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.60,000.00 ක් වැය දැරීමට යෝජනා කරනවා.අපි ගිය අවුරුද්දෙත් මේ වැඩසටහන කලා. තෝරාගත් දිළිඳු පෙර පාසල් තියෙනවා.ඒ සඳහා තමයි මේ යෝජනාව.

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගෞරවනීය සභාවෙන් අවසරයි.ගිය පාර තෝරාගත් පෙර පාසල වුනේ විජය උදාගම පෙර පාසල.පෙර පාසල් පාලිකාව ස්තුතිය ප්‍රකාශ කර හිටියා. ඒ වගේම හොඳ දායකත්වයක් ළමයින්ගේ ලොකු ඇගයීමක් තිබුනා. ඔබතුමා මේ ගෙනාපු යෝජනාව හොඳ යෝජනාවක්. ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී තෝරාගත් එක් පෙර පාසලක සිසුන් වෙනුවෙන් සතියකට එක් දිනක් බැගින් මාස 5 ක් දිවා ආහාර වේලක් ලබා දීමේ වැඩසටහනට 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.60,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>XIV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XIV දරණ යෝජනාව</u>**

ලෝක පරිසර දිනය වෙනුවෙන් පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන පාසල් පාදක චිත්‍ර තරඟය සහ ආහාර සුරක්ෂිතතාවය පිලිබඳ ප්‍රදර්ශනාත්මක වැඩසටහන සඳහා 205-6-iv වැයශීර්ෂය යටතේ වෙන්කරන ලද රු.100,000.00 ප්‍රතිපාදන වලින් ඉහත වැඩසටහන් ඉටු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීමට යෝජනා කරමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ඒ.මංජුල ප්‍රසන්න මංජුල මල්ලව ආරච්චි මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රිවරුගෙන් අවසරයි.අපි පරිසරය ගත්තොත් පරිසරය ආරක්ෂා කරන්න ලොකු කැපකිරීමක් කරන මොහොතක ඉදිරියටත් මේ කටයුත්ත සාර්ථකව කරගෙන යාම සඳහා මේ ගෙනා යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව ලෝක පරිසර දිනය වෙනුවෙන් පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන පාසල් පාදක චිත්‍ර තරඟය සහ ආහාර සුරක්ෂිතතාවය පිලිබඳ ප්‍රදර්ශනාත්මක වැඩසටහන සඳහා 205-6-iv වැයශීර්ෂය යටතේ වෙන්කරන ලද රු.100,000.00 ප්‍රතිපාදන වලින් ඉහත වැඩසටහන් ඉටු කිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා 1987 ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**XV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XV දරණ යෝජනාව**

පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 22 අතුරින් එක් කොට්ඨාශයකින් පිරිමි කණ්ඩායම් 01 ක් හා කාන්තා කණ්ඩායම් 01 ක් බැගින් සහභාගී කරගනිමින් පවත්වන අන්තර් ප්‍රජා මණ්ඩල වොලිබෝල් තරඟාවලිය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.300,000.00 ක් වැය දැරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.එම්. අජිත් තිලකසිරි මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඬුවස්නුවර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොට්ඨාශ 22 අතුරින් එක් කොට්ඨාශයකින් පිරිමි කණ්ඩායම් 01 ක් හා කාන්තා කණ්ඩායම් 01 ක් බැගින් සහභාගීකරගනිමින් පවත්වන අන්තර් ප්‍රජා මණ්ඩල වොලිබෝල් තරඟාවලිය සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ අංක 132 (ඒ) වගන්තිය ප්‍රකාරව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත ප්‍රාදේශිය සභා අරමුදලින් රු.300,000.00 ක් වැය දැරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**XVI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XVIදරණ යෝජනාව**

දොරටියාගෙදර මීදා වැව මාර්ගය තාරදමා සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.
ඇස්තමේන්තු ගත මුදල රු.6,500.000.00

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා- (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමනි, ඉතාම අත්‍යාවශ්‍ය කාරනාවක්. ඉතින් ඒ වෙනුවෙන් සභාව විසින් බොහොම අරපිරිමැස්මෙන් ඉතුරු කරපු මුදල් වලින් ලක්ෂ 65 ක මුදලක් වෙන් කිරීමත්,මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කිරීමටත් ස්තුතිය පුද කරමින් මේ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව දොරටියාගෙදර මීදා වැව මාර්ගය තාරදමා සංවර්ධනය කිරීම සඳහා සකස් කළ ඇස්තමේන්තුව අනුමත කිරීමත්, නියමිත ප්‍රසම්පාදන ක්‍රමය ඔස්සේ කොන්ත්‍රාත් කරු තෝරා ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**XVII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XVIIදරණ යෝජනාව**

දිවුල්කඩවර මාර්ගය තාර දමා අළුත්වැඩියා කිරීම සුදුසු බව යෝජනා කරමි.ඒ සඳහා සීමිත ලියාපදිංචි ටෙන්ඩර් ක්‍රමය යටතේ ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් මඟින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.
ඇස්තමේන්තු ගත මුදල රු.3,000.000.00

**ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)**

සභාපතිතුමා ඇතුළු ගෞරවනීය මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා**

ඇත්තටම ගත්තොත් මේ පාරවල් තාර දාපුවා.යන්නම බැරිව වලවල් හැදිලා තියෙන්නෙ.දැන් මේ පාරවල් සම්පූර්ණයෙන්ම හදන මට්ටමට වලවල් හැදිලා තියෙන්නෙ.ඒ නිසා අපි යෝජනා කරගත්තා ඔබතුමාලාගෙන් මං ඉල්ලා සිටිනවා.තාර දමා මාර්ග වල සහමුලින්ම මේ වගේ කැඩිලා තියෙන මාර්ග වෙන් කරගන්න ඕනි. අපි ඊළඟට අඩියක එකහමාරක විතර වලවල් දුරින් දුරින් හැදිලා තියන මාර්ග වෙනම කාණ්ඩයකටත්,යම්තම් සාමාන්‍ය චූටිවලවල් හැදීගෙන එන ඒවා වෙනමත් අරගෙන අපි තීරණය කරලා තියනවා.අඩියක් එකහමාරක් වලවල් හැදිලා තියෙන පාරවල් සෘජු ප්‍රී මික්ස් දාලා පාරවල් තාරදාලා කැඩෙන්න කලින් හදලා ඉවර කරගන්න ඕන.එතකොට අපේ නඩත්තු වියදම් අඩු කරගන්න පුළුවන්.ආයෙ පාරවල් අලුතින් හදන්න වෙන්නෙ නෑ.මේ ක්‍රමය යටතේ මේ අවුරුදු 2,3 ඇතුළත සම්පූර්ණ පාරවල් යන්න

පුළුවන් තත්වයට පත් කරන එක තමා ඉලක්කෙ.මේ අවුරුද්දේ මේ බ්‍රහස්පතින්දා ප්‍රි මික්ස් දාන වැඩේ ආරම්භ කරනවා.අපිට දැනට තියන ප්‍රශ්නෙ තමා සේවක ප්‍රශ්නෙ.මේක කරන්න ඉන්න අය දන්නෙ නෑ.දන්න අය හදාගන්න ඕන.හිටපු අය පෙන්ෂන් ගිහින් තියෙනවා.ඒ හින්දා දන්න අයගෙ උදව් ඉල්ලගෙන මේ වැඩේ ආරම්භ කරනවා.අනුමත කරලා දෙන්න කියලා ඉල්ලනවා.

**ඒ අනුව දිවුල්කඩවර මාර්ගය තාර දමා අළුත්වැඩියා කිරීම සඳහා සකස් කළ ඇස්තමේන්තුව අනුමත කිරීමත්, නියමිත ප්‍රසම්පාදන ක්‍රමය ඔස්සේ කොන්ත්‍රාත් කරු තෝරා ගැනීමත් සුදුසු බවට සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**<u>XVIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XVIIIදරණ යෝජනාව</u>**

පාතමුල්ල ගම මැද මාර්ගය උදිත මහතාගේ කඩය අසල සිට තාර දමා අළුත්වැඩියා කිරීම සුදුසු බව යෝජනා කරමි. ඒ සඳහා සීමිත ලියාපදිංචි ටෙන්ඩර් ක්‍රමය යටතේ ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් මඟින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.
ඇස්තමේන්තු ගත මුදල රු.3,000.000.00
මේකත් අළුත්වැඩියා කිරීමක්

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ජී. අජිත් ලක්ෂ්මන් මහතා - (ජා.ජ.බ)</u>**

විශේෂයෙන්ම පාතමුල්ල ගම මැද මාර්ගය අළුත්වැඩියා කිරීම කියන එක ප්‍රධාන ඉල්ලීමක්.ඒ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව මම සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**<u>ගරු මන්ත්‍රීනී ඩී. නිමාලි දිල්හානි මෙනවිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි,ඇත්තටම මම විශේෂයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මීට අවුරුදු 12 කට විතර උඩදි තමා ඔය පාර නිර්මාණය වුනේ.මේ වෙනකොට බොහොම අපහසුතාවයෙන් තමයි ගමන් කරන්නෙ මේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ.ඔය මාර්ගය කෙටි මාර්ගයක් විදිහට භාවිතා කරනවා වාරියපොල ටවුමට යන්න.ඒ නිසා සුදුසුම මාර්ගය තෝරාගෙන තියනවා.ඉතාම සාර්ථකව නිම කරන්න හැකියාව ලැබෙන්න කියලා මං කියනවා.විශේෂයෙන්ම ලක්ෂ 30 ක මුදලක් වෙන් කරලා තියනවා.කොට්ඨාශෙ මන්ත්‍රීවරිය ලෙස මගෙ ගෞරවනීය ස්තුතිය ඔබතුමාට මේ අවස්ථාවේ පුද කරනවා.

**ඒ අනුව පාතමුල්ල ගම මැද මාර්ගය උදිත මහතාගේ කඩය අසල සිට තාර දමා අළුත්වැඩියා කිරීම සඳහා සකස් කළ ඇස්තමේන්තුව අනුමත කිරීමත්, නියමිත ප්‍රසම්පාදන ක්‍රමය ඔස්සේ කොන්ත්‍රාත් කරු තෝරා ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**<u>XIX. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ).XIXදරණ යෝජනාව</u>**

නිකපිටිය මදුල්ල මාර්ගය තාර දමා අළුත්වැඩියා කිරීම සුදුසු බව යෝජනා කරමි. ඒ සඳහා සීමිත ටෙන්ඩර් ක්‍රමය යටතේ ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් මඟින් සිදු කිරීම සුදුසු බව යෝජනා කරමි.
ඇස්තමේන්තු ගත මුදල රු.3,000.000.00

**<u>ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.ඒ වගේම පුංචි දෙයක් එකතු කරන්න කැමතියි.මේ පාරේ කොටසක් මගේ කොට්ඨාශයටත් අයිති වෙනවා.මෙම මාර්ගය බොහෝ දුරට හැම ගංවතුරෙදිම අවුරුද්දකට දෙපාරක් කැඩෙන මාර්ගයක්.ඉතින් අපි යෝජනා කරලා තියෙනවා මේකට අළුතින් දොරවල් 3 ක් දැමිය යුතුයි කියලා. මේකෙදි දොරවල් 12 කින් එන වතුර දොරවල් 3 කින් තමා පිටාවන්නෙ.මේක සභාවට දරන්න අපහසු විශාල මුදලක් දරන්න වෙනවා සැරෙන් සැරේට.ඒ වගේම මේක සෑහීමකට පත් වෙන්න බෑ.පහුගිය කාලෙත් මේක හදලා කාපට් කරාට සම්පූර්ණයෙන්ම නන්දෙ මන්ත්‍රීතුමා දන්නවා පහුගිය ගංවතුරෙදි ඒක සම්පූර්ණයෙන්ම කැඩිලා බෑවුම පැත්තට ගිලා බැහැලා තියෙන්නෙ.ලක්ෂ 30 ක මුදල අවංකවම කියනවනම් මේකට ප්‍රමාණවත් මදි.කෝටි 2 ක් දැම්මත් මේ පාර හදන්න බෑ.මේ වෙනකොට දවසට වාහන 1000 කට එහා යනවා.මේක පළාත් පාලනයට පීආර්ඩී එකට යෝජනා කරන්න

කියලා මං ඉල්ලීමක් කරනවා.අපිට කරන්න බෑ.අපිට දෝෂාරෝපණය එනවා.නැවත මාස කින් ආයෙ වැස්ස ආවොත් මේ හදන එක ආයෙ කැඩිලා යනවා අර විදිහටම.මේකෙ පැති බැම්ම මීටර් 800,900 ක් විතර තියනවා මං හිතන්නෙ ඒක ස්ථිරව හදාගමු.මේක ප්‍රාදේශිය සභාවට දරන්න බෑ.අපි හදන මුදල නිරන්තරයෙන් අපතේ යනවා.ඒ නිසා මදුල්ලට හා නිකවැරටියට යන්න තියෙන ප්‍රධාන පාර මේක.මේක හැදීමෙන් ටවුමට ලොකු ආර්ථික වාසියක් ඇති වෙනවා.ඒ වගේම දිවුල්වැව මාර්ගය අවුරුද්දක් විතර හදන නිසා මේ මාර්ගයෙන් දැන් විශාල ප්‍රමාණයක් බර වාහන යනවා.ඒ නිසා මේක ස්ථිර වශයෙන් හොදට හදන්න පළාත් සභාවට යෝජනා කරමු කියන යෝජනාව මං මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ස්තුතියි ගරු මන්ත්‍රිතුමා මේ යෝජනාව ස්ථිර කිරීම පිලිබඳව.ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා ලක්ෂ 30ක මුදලක් හරි ඔබතුමාගේ ඇහැට ගැටිලා මේ පාරට වෙන් කිරීම පිලිබඳව ඒ කොට්ඨාශෙ සුනන්ද පුර කොට්ඨාශෙ මහජන නියෝජිතයා හැටියට මගේ ගෞරවනීය ප්‍රනාමය මේ අවස්ථාවේදී පුද කරන්න ඕන.අපේ මන්ත්‍රිතුමා කිව්ව විදිහට ගරු සභාපතිතුමනි, මං හිතනවා පොලීසිය ගාව ඉදන්ම හදන්න ගියොත් මේ ලක්ෂ 30 කොළමුණු ඔය ගාවට යද්දි ඉවර වෙයි.ඔබතුමාගෙන් මං ඉල්ලීමක් කරනවා.කාපට් එක නතර වෙලා තියෙන්නෙ කන්ද පාමුල.එතන ඉදන් තමයි ෆුට් සයිකලයක්වත් යන්න බැරි තත්වයක් උදාවෙලා තියෙන්නෙ.ඔබතුමා ඔය පාරේ යනකොට දකින්න ඇති.දෝතැල්ල කොට්ඨාශෙ මන්ත්‍රිතුමියත් ඒ පාරේ යන හින්දා දකිනවා.ඒ කන්ද පාමුල ඉදන් ඒ ටික තමයි අබලන්ම වෙලා තියෙන්නෙ.හැබැයි සභාපතිතුමනි හදන ටික අපි හරියට හදන්න එපැයි.බොරුවට තැන් තැන් වල පැච් දාගෙන ගිහිල්ලා හදලා වැඩක් නෑ.මං ඔබතුමාගෙන් ඉල්ලනවා.දාන ටික හරියට දාමු.මීටර් 100 හරි 200 හරි කමක් නෑ.මොකද මේ වෙනකොට අර දාපු තාර සියල්ලම ඒ පාරේ තැන් තැන් වලින් ගැලවිලා.කඩතොළු මතුවෙලා තියෙනවා.ආපහු මේ කඩතොළු මකලා මීටර් 100 ක් 200 ක් හරියට හදලා ඒකට උඩින් තාර කෝඩ් එකක් දැම්මම මං හිතනවා ඒ පාර සදාකල් තියේවි.ඒ නිසා මං ඔබතුමාගෙන් ඉල්ලනවා අර මීටර් 200 ක් හරි පැච් ටික මකලා තැන් තැන් වලින් දාන්නෙ නැතිව ඔය පාර තුන් හතර වතාවක් අපි අළුත්වැඩියාත් කරා.ඔබතුමාගෙන් මං බොහොම නිහතමානීව ඉල්ලනවා හදන මීටර් 200 හරි අපි සම්පූර්ණ තාර කෝඩ් එකක් එලමු.තාර කෝඩ් එකක් එලුවොත් සභාපතිතුමා මං දන්න විදිහට පැහැදිලිවම ආයෙ ගැලවෙන්නෙ නෑ.හැබැයි තැන් තැන් වල පැච් මක මකා ගියොත් එහෙම ගැලවෙනවා.ඒ හින්දා ඔබතුමාගෙන් මං ඉල්ලනවා. හදන ටික හරි අපි හරියට හදමු.මෙතුමා අර පළාත් සභාවට යොමු කරපු කිව්ව එකට ඇත්තටම මං කැමතියි.එතකොට අපේ සභාවේ සල්ලි අඩු හින්දා කරන්න අපහසුයි.මොකද මෙතුමා කියපු කාරනේ ඇත්ත.නිකපිටියේ අපේ කොටොම්පිටියෙ වෙල්යායෙ ඇනිකට් එකේ ගරු සභාපතිතුමනි දොරවල් 12 ක් විතර තියෙනවා.ඒ දොරවල් 12 එකපාර ඇරපුවාම ගංවතුර එනකොට මේ දොරවල් තුනෙන් පිට කරන්න බෑ.අරහෙන් දොරවල් 12 ක වතුර මේ දොරවල් තුනෙන් පිට කරන්න බෑ.පාර සම්පූර්ණයෙන්ම යට වෙනවා. ගම්මානෙත් එක්ක යට වෙනවා.ඒක තමයි ප්‍රධාන හේතුව.ඒ හින්දා මෙතුමා කිව්ව විදිහට පැහැදිලිවම මේකට අළුතින් දොරවල් 3 ක් විතර දාන්න වෙනවා. ඒ කටයුත්ත අපිට සභාවක් විදිහට කරන්න බැරි හින්දා මමත් ඒ යෝජනාවටම යෝජනාවක් විදිහට ඒ යෝජනාව සම්මත කරනවා.ඒක හොඳ වැඩක්.එහෙම නැත්තම් මේ පාර අපිට නඩත්තු කරගන්න බැරිවෙනවා.ඒ නිසා ඔබතුමාට පුළුවන්නම් පලාත් සභාව හරහා කථා කරලා දැන් පළාත් සභාව නැති නිසා ආණ්ඩුකාරතුමා ඉන්නෙ.ඒ හින්දා මුදල් ප්‍රතිපාදන අරන් මේ ඇනිකට් එකට තව දොරවල් ටිකක් දාලා පුළුල් කරන්න පුළුවන්නම් වඩා හොදයි කියලා මමත් කියනවා.ස්තුතියි.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

බොහොම ස්තුතියි මන්ත්‍රිතුමා. අපේ ලාලිත ඉඳුනිල් මන්ත්‍රතුමා ගෙනාපු යෝජනාව හොඳ යෝජනාවක්.ඇත්තටම පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරිය යුතු මාර්ග කීපයක්ම තියනවා.අපි ඒ සම්බන්ධයෙන් යෝජනා පළාත් සභාවට යොමු කරන්න ඕන.මොකද මේ වගේ මාර්ග ප්‍රාදේශීය සභාවකින් නඩත්තු කිරීම හරිම අමාරුයි.කෝටි ගණන් එක මාර්ගයකට වියදම් කරන්න ගියොත් එහෙම ප්‍රාදේශිය සභාවේ අනිකුත් මාර්ග සහ අනිකුත් කටයුතු කරගන්න බැරිවෙනවා.ඒ වගේම තමයි මම කියන්න කැමතියි.ඔබතුමාට අපි දොරවල් වලට අපි මේ පාර මුදල් වෙන් කරලා තියෙන්නෙ.මේ පාර

ඉදිවෙනවා.ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙ මුදල් වලින් එන මුදල් ටික වියදම් කරලා අපි දොරවල් ටික හදනවා.මොකද පාර කොච්චර හැදුවත් වැඩක් නෑ.කැඩෙන ක්‍රමවේදය වෙනස් කරේ නැත්තම්.

**ඒ අනුව නිකපිටිය මදුල්ල මාර්ගය තාර දමා අළුත්වැඩියා කිරීම සඳහා සකස් කළ ඇස්තමේන්තුව අනුමත කිරීමත්, නියමිත ප්‍රසම්පාදන ක්‍රමය ඔස්සේ කොන්ත්‍රාත් කරු තෝරා ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>XX. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර විසින් කරනු ලබන අංක 6.(ඉ). XX දරණ යෝජනාව</u>**

දෙමළදොර ගම මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම සුදුසු බව යෝජනා කරමි.
ඇස්තමේන්තු ගත මුදල රු.6,500.000.00

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභාවෙන් අවසරයි.මේක අර කිව්ව ලක්ෂෙ මාර්ගවලට අදාල එකක්.ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණාසාගර මහතා</u>**

මේක අර කිලෝමීටර් ලක්ෂෙ ව්‍යාපෘතියෙ ආරම්භ කරපු එකක්.ඒබීසී දාලා සම්පූර්ණයෙන්ම නතර වෙලා තියෙන්නෙ.වලවල් හැදිලා තියෙන්නෙ.මේක කුලියාපිටිය මාර්ගයත්, වාරියපොල මාර්ගයත් යා කරන මාර්ගය.

**<u>ගරු මන්ත්‍රිනී එම්. නිශාන්ති ගුණතිලක මහත්මිය - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමනි, මං හිතන්නෙ මාර්ග සංවර්ධන යෝජනා නෙ නෑ.ඇත්තටම පුංචි අදහසක් ඉදිරිපත් කරන්නම්.මගේ කොට්ඨාශෙ බණ්ඩාරකොස්වත්ත කොට්ඨාශෙ මන්ත්‍රි කෙනෙක් නියෝජනය කරන්නෙ නෑ ඔබ පක්ෂෙන්.ඒ හින්දා මං මේ කාරණාව කියන්නෙ.කොට්ඨාශ සියල්ලටම සාධාරණයක් සිද්ධ වෙන්න ඕන.අපේ ප්‍රදේශීය සභා අරමුදල් වැය කරද්දි.ඉතින් ඇත්තටම දෙමළදොර, දිවුල්කඩවර කියන්නෙ ඔබතුමාගෙ තිස්සව කොට්ඨාශෙ කෝටියකට ආසන්න මුදලක් වැය කරලා තියනවා.ඔබතුමාගෙ අල්ලපු කොට්ඨාශෙ තමයි යායේ ගෙදර කොට්ඨාශෙ.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මන්ත්‍රිතුමිය කලබල වෙන්න එපා.එකක් තමයි දෙමළදොර පාර අලුතෙන්ම හදන්න තියෙන්නෙ යන්න බැරි පාරක් හදන්නෙ.ඔබතුමිය කලබල වෙන්න එපා.ඔය ලක්ෂෙ ව්‍යාපෘතියෙ ඔබතුමිය කියන ඔය යායේගෙදර පාර මිලියන 2.5 ක් මේ අවුරුද්දට ආර්ඩී එකෙන් දාලා තියෙන්නෙ.කඩවලගෙදර නල්ලුර පාරටත් මිලියන 2.5 ක් ආර්ඩී එකෙන් දාලා තියනවා.

**ඒ අනුව දෙමළදොර ගම මැද මාර්ගය තාර දමා සංවර්ධනය කිරීම සඳහා සකස් කළ ඇස්තමේන්තුව අනුමත කිරීමත්, නියමිත ප්‍රසම්පාදන ක්‍රමය ඔස්සේ කොන්ත්‍රාත් කරු තෝරා ගැනීමත් සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**<u>XXI. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර විසින් කරනු ලබන අංක 6.(ඉ). XXI දරණ යෝජනාව</u>**

2026 කමිටු සඳහා පත්කර ඇති පහත නම් සඳහන් නිලධාරීන් වෙනුවට නව නිලධාරීන් පත් කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී ජේ.ආර් ටේලර් මිය විශ්‍රාම යාම නිසා ඒ වෙනුවට එච්.එම්.ඩී.එච් මැණිකේ මිය

වැඩ අධිකාරී අපේ හිටපු සඳරුවන් මහත්තයා වෙනත් ආයතනයකට මාරු වෙලා ගියා ඒ.වෙනුවට පී.ඩී.ඩී.එස් ගුණතිලක මයා ස්ථාන මාරු යාම නිසා ඒ වෙනුවට තාක්ෂණ නිලධාරී එස්.එච්.එම්.එල්.එස් සුගතදාස මයා.

කළමනාකරණ සේවා නිලධාරී එච්.එම්.ඩී.එච් මැණිකේ මියගේ විෂය මාරු වීම නිසා ඒ වෙනුවට සංවර්ධන නිලධාරී එස්.එම්.කමනි සංසාරිකා මුතුනායක මිය

**<u>ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)</u>**

ගරු සභාවෙන් අවසරයි.සභාපතිතුමා ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව 2026 කමිටු සඳහා පත්කර තිබූ නිලධාරීන් වෙනුවට නව නිලධාරීන් පත් කර ගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණ සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

**XXII. ගරු මන්ත්‍රී එච් .එම්.නිශ්ශංක රම්‍ය කුමාර හේරත් මහතා විසින් කරනු ලබන අංක 6.(ඉ). XXII.දරණ යෝජනාව**

ඔබතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි.ඒ වගේම උප සභාපතිතුමා සියළු මන්ත්‍රි මණ්ඩලය සහ ලේකම්තුමිය ඇතුළු සියළු කාර්ය මණ්ඩලයෙන් අවසරයි විශේෂයෙන්ම අංක 6.(ඉ). XXIIයෝජනාව යටතේ මිදෙල්ල කඩවර මිනීපිටියේ සිට දුමින්ද මහතාගේ නිවස අසල කොන්ක්‍රිට් දැමූ ස්ථානය දක්වා බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බව යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රිනී ඩබ්.ටී.එම්. චාන්දනී දීපිකා රත්නායක මහත්මිය - ( ස.ජ.බ)**

ගරු සභාවෙන් අවසරයි.ඒ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

ගරු සභාපතිතුමනි.විශේෂයෙන්ම දිටිවා සුලි කුනාටුව ඉවර වුනත් මං හිතන්නෙ ඒකෙ බලපෑම් තාම ඉවර වෙලා නෑ.විහේෂයෙන්ම මිදෙල්ල කඩවර මඩඉන දක්වා මාර්ගය දිටිවා සුලි කුණාටුව මොහොතේ ගංවතුරෙන් ඉනක් පමණ යටවෙච්ච මාර්ගයක්.විශේෂයෙන්ම මෑතක පෞද්ගලික සමාගමක් හරහා මඩ ඉන්න පංසල ආසන්න මාර්ගය කොන්ක්‍රිට් දාලා තියනවා.විශේෂයෙන්ම කියන්න ඕන.ඒ මාර්ගය නම් කරලා තිබ්බා.මේ මාර්ගවලට බොරළු දාපු එක සංශෝධනයක් මෙතන තියනවා.ඒකෙ තියනවා පොල්කුඹුර මඩඉන පාර-රු.502,500.00 ක් සහා ආයෙ මිදෙල්ල කඩවර කොළමුණු ඔය පාර කියලා රු.158,600.00ක් වෙන් කරලා තියනවා.මේ මාර්ග දෙකෙන්ම කියවෙන්නෙ එකම මාර්ගය තමා අවසානෙට. ඉතින් විශේෂයෙන්ම මේ මාර්ගයේ කොටසකට බොරළු දාලා තියෙනවා.හැබැයි දාලා තියන කොටසත් සභාවේ මුදල් අවභාවිතා කරලා කියලා හඳුන්වන්න පුළුවන්.මොකද හේතුව පුද්ගලික සමාගමක් හරහා මුදල් පරිත්‍යාග කරලා කොන්ක්‍රිට්දාන්න නියමිත මාර්ගයේ තමා සභාවේ මුදල් වැය කරලා බොරළු දාලා තියෙන්නෙ.අද ඒ බොරළු දාපු කිසිම තැනක් නෑ.ඔබතුමාලගෙ පාක්ෂිකයෙක් හරහා තමා මේ කොන්ත්‍රාත් එක කරලා තියෙන්නෙ.

**ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා**

මන්ත්‍රිතුමා නිවැරදි කිරීමක් කරන්න ඕන.අපි පාක්ෂිකයන්ට කොන්ත්‍රාත් දිලා නෑ.ටෙන්ඩර් කරලා ටෙන්ඩර්කරුවන්ට තමයි කොන්ත්‍රාත් දීලා තියෙන්නෙ.ඒ ටෙන්ඩර් ප්‍රොසීඩියර් එක හරියට ක්‍රියාත්මක වෙලා තියෙනවා.දැන් වෙන ලේබල් එකක් ගහන්න හදන්න එපා. පුළුවන්නම් ඔප්පු කරන්න අර කොන්ත්‍රාත් එක ඇතුලෙත් බොරළු අතුරන්න තියනවද කියලා. ඒ හදලා තියන විදිහට මන්ත්‍රිතුමා හොදට මතක තියාගන්න ආයෙ ඒ පාර කැඩෙන්න නැතිවෙන්න සභාවෙන් බොරළු අතුරලා තියනවා.බොරළු අතුරලා පාර හොදට හැදුවට පස්සෙ ඒක උඩින් කොන්ක්‍රිට් එක දාන්න පුළුවන්.ඒ නිසා ඔබතුමා උත්සාහ කරන්න එපා වෙන දේවල් මේකට ආරෝපණය කරන්න.අනිත් එක ඒක හැදුවෙ පුද්ගලික සමාගමක් නෙමේ මන්ත්‍රිතුමා සාක් ව්‍යාපෘතිය යටතේ ආපු මුදල් වලින් තමයි මේක හැදුවෙ.ඒකට අතරමැදියෙක් ලෙස ඔය පුද්ගලික ආයතනය සම්බන්ධ වුනා.සාක් ව්‍යාපෘතිය කියන්නෙ කෘෂි කර්මාන්ත්‍යාංශය හරහා සම්බන්ධ වෙන ප්‍රෙජෙක්ට් එකක්.ඒ ප්‍රොජෙක්ට් එක හරහා තමයි මේ පාර හැදුවෙ.මොකද කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම, වාරි මාර්ග, පශු සම්පත්, ඉඩම් ඒ වගේම මහවැලි අමාත්‍යාංශයෙත්, දීවර අමාත්‍යාංශයෙත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සම්බන්ධිකරණය කරන්නෙ මම.එනිසා අර පුද්ගලික සමාගමක මුදල් නෙමේ ඒවා.

**ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)**

මං අදහස් කලේ.ඇත්තටම මේ මාර්ගය ඉදිකරන බව ඔබතුමාලා කලින් දැනගෙන තිබුනා.කොන්ක්‍රිට් අතුරන බව.දැන් මම කියන්න උත්සාහ කරන්නෙ මේක දැන දැන අපේ මේ මම නම් කරලා තියෙන මිදෙල්ලකඩවර මිනීපිටියෙ ඉදලා දුමින්ද මහතාගේ නිවස කිය තැන දක්වා කිසිම කොන්ක්‍රිට් දැම්මක් හෝ කිසිම දෙයක් සඳහා යොමු වෙච්ච නැති මාර්ගයක්.එතකොට ඒ ටික ඉතිරිකරලා කොන්ක්‍රිට් දාන්න තිබ්බ ටිකට විතරයි බොරළු ටික දාලා තියෙන්නෙ.හැබැයි අර යට වෙච්ච ඉතුරු මාර්ගය වලවල් සහිතව ගමන් කිරීමට නොහැකිව අද ජනතාව අපහසුතාවයට පත් වෙලා තියනවා.ඒ වගේම මේ දාලා තියෙන මාර්ග දෙක

එකම මාර්ගයක්. පොල්කුඹුර මඩඉන පාර හා ඊට පහලින් දාලා තියනවා මීදෙල්ලකඩවර කොළමුණු ඔය කියලා.අපිට පැහැදිල නෑ මේක.මොකක්ද මේ කොහොමද බොරළු දාලා තියෙන්නෙ කියලා.දෙපාරක් දාලාද?කොයි විදිහට දාලාද? ඒක එතකොට දියිවා සුළි කනාටුව හරහා ඔබතුමාලගෙ හිතවාදීන්ට මේ බොරළු දැමීම හරහා යම් වාසියක් අත් කර ගැනීමට කටයුතු කලාද කියලා හිතෙනවා.මොකද විශේෂයෙන්ම ඔබතුමාලා මේකෙ ටෙන්ඩර් කැදවලා තිබ්බෙ කියුබ් 3 ලොරිවලින් තමයි.හැබැයි අපි දන්නවා.මේ තනි කියුබ් ඒකක් කියලා කියන්නත් බැරි අඩි 85 ලොරි වලින් තමයි බොරළු දැමමේ.ඉතින් ඒවා කව්ද මැන්නෙ.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මන්ත්‍රීතුමා ඒවා මැන්නෙ TO මහත්වරු, SW මහත්වරු.අපි මැන්නෙ නෑ.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

TO මහත්වරු කොහොමද කියන්නෙ. අපි ඔය කියන ලොරියක බොරළු ප්‍රමාණ මැන්නද? කොහොමද මැනපු ක්‍රමය. අපිත් දූෂණයට විරුද්ධයි. අපිත් කැමතියි මේ ලැබෙන බදු මුදල් නිසි ආකාරව ජනතාවගෙ සුභසිද්ධිය වෙනුවෙන් වැය කරනවට.හැබැයි මේක මං පැහැදිලිවම දන්න දෙයක් තමයි.අඩි 85 ලොරිය කොහොමද කියුබ් එක වුනේ.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මන්ත්‍රීතුමා මේවා TO මහත්වරු හරියට මැනලා හරියටම වැඩේ කරලා තියනවා.ඇත්තටම ගත්තොත් අපේ සමහර අයට කරපු මැදිහත් වෙච්ච අයට අතින් ගිහිල්ලා තියෙන්නෙ.හේතුව තමයි.කියුබ් 1 කියලා ගෙනත් දැම්මට ඇත්තටම එයාලා ඇස්තමේන්තු කලේ ඒකෙ තියන 80 ද 75 ද ඔන්න ඔහොම ගණන් දාලා තමයි ඇස්තමේන්තු හදලා තියෙන්නෙ.ඒ නිසා සෑහෙන අපහසුතාවයකට මුහුන දුන්නා සමහර අයට මුදල් ගෙවන්න ගියාට පස්සෙ අඩු මුදලක් තමයි මේකට ඇස්තමේන්තු කලේ.ඒ නිසා ඔබතුමා කලබල වෙන්න එපා.කණගාටු වෙන්නත් එපා.අපේ නිලධාරීත් දැන් හරියට වැඩේ කරනවා.මොකද එහෙම නොකර දැන් යන්න බෑ කියලා දන්න නිසා. අපේ මහජන නියෝජිතයො මේ ඇවිල්ලා ඉන්නෙ ඔය පෙර වැඩ වලටනම් නෙමේ.ඒ ගැන කණගාටු වෙන්න එපා.කලබල වෙන්න එපා.

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

සභාපතිතුමා මේකෙ 48 යටතේ රු.3000.00 ක් දාලා තියෙනවා.බොරළු කියුබ් දෙකක් දාලාද

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ඒක ප්‍රින්ටින් මිස්ටේක් එකක්ද කියලා හොයලා බලමු

**<u>ගරු මන්ත්‍රී ආර්.එම්. උපුල් නිශාන්ත මහතා - (ජා.ජ.බ)</u>**

48 බෝධිමුල්ල නෙත්මිණි උයන ග්‍රාම ලේකම් කාර්යාලය දක්වා මාර්ගය අපි කුලියට ගත්ත මෝටර් ග්‍රේඩරය යෙදෙව්වා. නිලන්ති මන්ත්‍රීතුමිය දන්නවා.ඒකට තමා මේ මුදල ගෙවලා තියෙන්නෙ

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

හරි ඔබතුමා කිව්වනෙ TO මහත්වරු මේක මැන්නා කියලා. හැබැයි බොරළු දාන අවස්ථාවේ මමත් එතන හිටියා.හැබැයි TO මහත්වරු මං දැක්කෙ නෑ.මනින්න ඇවිල්ලා ඉන්නවා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

ලොරි මැනලා තියෙන්නෙ.පාරවල් මැනලා තියෙන්නෙ.දුර මැනලා තියෙන්නෙ.ලොරියෙ උස මැනලා තියෙන්නෙ.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ලොරියෙ උස වෙනස් වෙන්නෙ නෑ සභාපතිතුමා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මන්ත්‍රීතුමා බය වෙන්න එපා.ඔබතුමා හිතන විදිහට වෙන්නෙම නෑ.මොකද ඔය ඒ විදිහෙ පුරුදු නෑ අපේ මන්ත්‍රීතුමාලට

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ඔබතුමාලා බොරළු කියුබ් එකක් ගත්තෙ කීයටද? ඔබතුමාලා ගාවට අපි ඇවිල්ලා කතා කරද්දි රු.1500 ට වැඩියෙන් බොරළු කියුබ් එකක් ගන්නෙ නෑ කිව්වා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මන්ත්‍රීතුමා කම්ටුවලට දාලා අනුමත කරලා බොරළු ගත්තෙ.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

මට අවස්ථාව දෙන්න කථා කරන්න.මට වාර්තාවක් දෙන්න පුළුවන්ද මේ මාර්ග සඳහා බොරළු දැමීම සම්බන්ධව.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

හරි ඔබතුමාට වාර්තාවක් දෙන්නම්.ඔබතුමා වාඩිවෙන්න

**<u>ගරු මන්ත්‍රී සී.පී. රංජිත් අබේපාල මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා.බොරළු දාපු ඒවට මේ මුදල් ගෙව්වෙ කාටද කියන එක මම දැනගන්න කැමතියි.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මං මේක ආරම්භයේදිත් දැනුම් දීමක් ලෙස කරා.කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ අපිට සම්බන්ධ කිසිම කෙනෙක් මේ දේශපාලන ව්‍යාපාරය බදාගෙන නෑ ඔය අදහසින්.ඔය චෝදනාව ගහලා අපිව වට්ටන්න හම්බ වෙන්නෙ නෑ.

**<u>ගරු මන්ත්‍රී එච්.එම්. නිශ්ශංක රම්‍යකුමාර හේරත් මහතා - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

බොරළු ලෝඩ් දෙකයි දාලා තියෙන්නෙ.පොල්කුඹුර මාර්ගයේ ඒ කෑල්ලට

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

මන්ත්‍රීතුමා ඔබතුමා කියනවනම් මේ මුදලට දාලා තියෙන්නෙ බොරළු ලෝඩ් දෙකයි කියලා තියෙන්නෙ කියලා.අපි ඒකට ක්ෂෙත්‍ර පරීක්ෂණයක් පවත්වනවා.ඒ ක්ෂෙත්‍ර පරීක්ෂණය පවත්වලා මුදලට සරිලන ඇස්තමේන්තු ප්‍රමාණය දාලා නැත්තම් අපි ඒකට අදාල නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා.ඊළඟ ඔබතුමා අර අහපු රු.3000 ඒ.තියෙන්නෙ බැකෝ යන්ත්‍රයට පැයකට ගෙවපු ගාන. මේ දියීවා සුළි කුනාටුව නිසා ක්ෂණිකව පාරවල් හදන්න කියලා ඒකට වෙනම උපදෙස් දීලා වැඩකටයුතු කලේ. මුදල් ගෙවීමට මුදල් වැය කිරීමට මේ කර්මාන්තය කිරීමට අවශ්‍ය කරන නිර්දේශ දීලා තියෙනවා.ඒ නිර්දේශ යටතේ තමයි කටයුතු කරලා තියෙන්නෙ.ඒ නිර්දේශ යටතේ කටයුතු කරලා නැත්තම් ඔබතුමාලා නීතිමය ක්‍රියාමාර්ග ගන්න. රංජිත් අබේපාල මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නෙ මන්ත්‍රීතුමා පාරවල් 107 ක් හදලා තියනවා.ඒ පාරවල් 107 ටම මුදල් ගෙවන වැඩසටහන ඇත්තටම ෆයිල් අවසන් කරලා අත්සන් කලේ ඊයෙ දවසෙ තමයි.

**<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

ගරු සභාපතිතුමා මගේ සහෝදර මන්ත්‍රීතුමාගේ යෝජනාව වෙනුවෙන් අදහස් දක්වන්න අවස්ථාව ඉල්ලා සිටිනවා.මීදෙල්ලකඩවර මිනීපිටියේ සිට දුමින්ද මහතාගේ නිවස අසල කොන්ක්‍රීට් දැමූ ස්ථානය දක්වා මාර්ගය ඉදිරියට සංවර්ධනය කරගැනීම සඳහා තමා එතුමා යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නෙ.මෙතනදි ඔබතුමා පැහැදිලිවම කිව්වා.

**<u>ගරු සභාපති වයි.ජී. සංජීව කරුනාසාගර මහතා</u>**

එතුමගෙ යෝජනාව ගැන කතා කරමු මන්ත්‍රීතුමිය.එතුමා කතා කරපු පාර සම්බන්ධව කථා කරන්න

**<u>ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)</u>**

යෝජනාව ගැන සහ ඒකට කතා කරපු ඉදිරිපත් කරපු කරුණු ගැන විතරයි මෙතනදි මම කථා කරන්නෙ.පාර සම්බන්ධව විතරක් නෙමේ සභාපතිතුමා යෝජනාවක් ගැන කතා කරපුවම ඒ යෝජනාව සම්බන්ධව අපිට අපහැදිලි නම් මේ සභාවෙ මිසක් එළියට ගිහිල්ලා කරුණු විමසන්න බෑ නෙ.මං කියන්නෙ මේකෙ රු.3000. ක් වෙන් කරපු එකට අපේ සහෝදර මන්ත්‍රීතුමා පැහැදිලි කරා භූමිය මෝටර් ග්‍රේඩර් කරා.එතකොට එයා ඒ රු.3000. ඒකට නිර්වචනය කරේ එහෙම.ඔබතුමා ඒ 3000 ට කිව්වෙ ප්‍රන්ටින් මිස්ටේක්.

**<u>ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා</u>**

නෑ.මන්ත්‍රීතුමිය ඒ බැකෝ එකට පැයකට ගෙවපු ගාන

**ගරු මන්ත්‍රිනී අයි.සද්නා දිල්හානි ප්‍රනාන්දු මහත්මිය - (ශ්‍රී.ල.පො.පෙ)**

මං කියන්නෙම මේ තරමටම හැල්ලු වෙන්න දෙන්න එපා.මං කියන දේ නිවැරදිද නැද්ද මං සභාවට යෝජනාවක් දැම්මා .ඒ යෝජනාව ප්‍රතික්ෂේප කරලා එවලා තියනවා.මට ඒ වුනාට දැන් කාරණාව පැහැදිලියි.මොකද මගෙ යෝජනා සභාවට ඉදිරිපත් කරනවට මට සීමා කරලා කියන එක.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

නිවැරදි නෑ මන්ත්‍රිතුමිය.යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට කරුනු ඉදිරිපත් කරලා තියනවනෙ මන්ත්‍රිතුමිය.

**ඒ අනුව මිදෙල්ල කඩවර මිනීපිටියේ සිට දුමින්ද මහතාගේ නිවස අසල කොන්ක්‍රිට් දැමූ ස්ථානය දක්වා බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**XXIII. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර විසින් කරනු ලබන අංක 6.(ඉ). XXIII දරණ යෝජනාව**

පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී වශයෙන් කටයුතු ජයනාලි රත්නසිකා වෙලර් (785252560V) මහත්මිය 2026.03.01 දින සිට විශ්‍රාම යාම හේතුවෙන් චෙක්පත් සඳහා අත්සන් කිරීමේ දෙවන අත්සන්කරු ලෙස හේරත් මුදියන්සේලාගේ දූලානි හේරත් මැණිකේ (198978700460) මහත්මිය වෙත බලතල පැවරීම සුදුසු බවට ගෙන එන යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.

**ගරු උප සභාපති බන්දුල සමරවික්‍රම මහතා -(ජා.ජ.බ)**

ගරු සභාවෙන් අවසරයි.සභාපතිතුමා ගෙන ආ යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ඒ අනුව පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී වශයෙන් කටයුතු ජයනාලි රත්නසිකා වෙලර් (785252560V) මහත්මිය 2026.03.01 දින සිට විශ්‍රාම යාම හේතුවෙන් චෙක්පත් සඳහා අත්සන් කිරීමේ දෙවන අත්සන්කරු ලෙස හේරත් මුදියන්සේලාගේ දූලානි හේරත් මැණිකේ (198978700460) මහත්මිය වෙත බලතල පැවරීම සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සහා සම්මත කරන ලදී .**

**XXIV. ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර විසින් කරනු ලබන අංක 6.(ඉ). XXIV දරණ යෝජනාව**

2026.02.13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ අංක 34 යටතේ නිර්දේශ කරන ලද පරිදි පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත වැඩ ක්ෂෙත්‍ර කම්කරුවන් 06 ක් ගිවිසුම් පදනම මත අළුතින් බඳවා ගැනීමට හා සභා අරමුදලින් දීමනා ගෙවීමත් සම්බන්ධ යෝජනාව මා විසින් ඉදිරිපත් කරනවා.

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

ගරු සභාපතිතුමා සියළු දෙනාගෙන් අවසරයි.මේ ඔබතුමා ගෙනාපු යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති වයි.ජී.සංජීව කරුණා සාගර මහතා**

මේක යෝජනා කරන්නෙම.අපේ හිටපු ප්‍රධානම කෙනෙක් තමයි සුමති මහත්තයා සුමති මහත්තයා ඇතුළු විශාල පිරිසක් දැන් විශ්‍රාම ගිහිල්ලා සිටිනවා. මුරකරුවොත් විශාල ප්‍රමාණයක් විශ්‍රාම ගිහිල්ලා තියනවා. අපේ ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයත්, කුණු එකතු කරන වැඩෙත් බොහොම අමාරුවෙන් තමයි පවත්වාගෙන යන්නෙ. සමහර දවස්වලට 6 දෙනෙක් ඉන්න යන වැඩේ දෙන්නෙකුගෙන් අපහසුතාවයෙන් පවත්වාගෙන යන්නෙ. ඒ නිසා අපිට මේ සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලනවා.

**ගරු මන්ත්‍රී ආර්.ඩී. ලාලිත ඉඳුනිල් මහතා - (ජා.ජ.බ)**

මමත් අදහසක් එකතු කරන්න කැමතියි.මේ සේවකයන් බඳවා ගැනීමේදී විශේෂයෙන් ඔවුන්ගේ සෞඛ්‍ය තත්වය සහ පවුල් තත්වය සලකා බලන්න ඕන.මොකද බොහෝ විශාල පවුල් බරක් තියෙන අය ඒවට

ගත්තොත් ඒ ගොල්ලන්ගෙන් වැඩක් ගන්න අමාරුයි.දවල් 12 ට ළමයි ගේන්න යනවා. නමුත් මේ මාර්ග නඩත්තු ඒකකයේ අද විශාල වශයෙන් අවශ්‍යතාවය පෙනිලා තියනවා.ඒ නිසා මේ මාර්ග ක්ෂේත්‍ර කම්කරුවන් වැරදි පුරුදු මත්පැන්, සිගරට්, ගංජා, කුඩු වගේ ගහන අය ගන්න එපා.ගන්න අය ගැන හොඳට හොයලා බලලා ගන්න.යම්කිසි නිර්දේශයක් ඇතිව හොද නිරෝගිමත් පුද්ගලයො ප්‍රශ්න අඩු අය හොයලා බලලා ගන්න කියන අදහස මම ඉදිරිපත් කරනවා.

**ඒ අනුව 2026.02.13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ අංක 34 යටතේ නිර්දේශ කරන ලද පරිදි පඩුවස්නුවර ප්‍රාදේශිය සභාවේ පවතින සේවා අවශ්‍යතාවය මත වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 06 ක් ගිවිසුම් පදනම මත අළුතින් බඳවා ගැනීමට හා සභා අරමුදලින් දීමනා ගෙවීමත් සම්බන්ධ යෝජනාව සුදුසු බවට ගෙන ආ යෝජනාව ගරු සභාවේ එදින පැමිණි සිටි සභිකයන් විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී .**

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම් කුමාරසේන ජයලත් මහතා ප.ව.12.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.30 ට පමණ ගරු සභාවෙන් බැහැරට ගියා.

ඒ අනුව

**<u>ගරු මන්ත්‍රී කේ.එම්. නන්දසිරි මහතා - ( ස.ජ.බ)</u>**

ගරු සභාපතිතුමා .විනාඩියක් දෙන්න.මම ලේකම්තුමියගෙන් ඉල්ලනවා.මං හිතනවා මේ වාර්තාවේ තිබුනා ඒ සහ ඕ හරහා මේවා ආණ්ඩුකාරතුමාගෙ අනුමැතිය යටතේ ක්‍රියාත්මක වෙනවා කියලා.ඔබතුමියගෙන් මං ඉල්ලනවා.ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණු සැනින් මේවා ආරම්භ කළාට ගැටළුවක් නෑ.ඒ නිසා ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණු බව මහ සභාව දැනුවත් කරන්න කියලා.

- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී කේ.එම් කුමාරසේන ජයලත් ප.ව.12.32 ට පමණ ගරු සභාවට පැමිණියා.
- ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එස්.එච්. මාලක අරුණ කුමාර මහතා ප.ව.12.32 ට පමණ ගරු සභාවට පැමිණියා.

**(ඊ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවෙලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.**

**(ඊ). I. 2026.02.13 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). II. 2026.02.13 දින පැවති ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(ඊ). III.2026 ජනවාරි මස අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම**

**(ඊ). IV. නිවාස හා ප්‍රජා සංවර්ධන පිලිබඳ කාරක සභා වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**(උ) ලැබීම් හා වියදම් පිලිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිලිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම**

**(උ) I. <u>2026 ජනවාරි මස ප්‍රා.ස.14 (මාසික ඒකාබද්ධ වැය සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.</u>**

**උපලේඛන 01 සඳහා අනිත් පිට බලන්න**

| පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | | | ප්‍රා.ස-14 |
|---|---|---|---|---|---|---|---|
| මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2025 ජනවාරි | | | | | | | |
| වැය විෂය නාමයන් | 1<br>පොදු<br>පරිපාලනය | 2<br>සෞඛ්‍ය<br>සේවා | 3<br>භෞතික සැලසුම්<br>මංමාවත් ඉඩම් | 4<br>ජල<br>සේවා | 5<br>වනත් උපයෝගි<br>සේවා | 6<br>සුභසාධක<br>සේවා | එකතුව |
| වැටුප් හා දීමනා | 2270193.00 | 1101014.00 | 1862117.24 | 63225.00 | 136826.00 | 4575314.00 | 10008689.24 |
| ගමන් වියදම් | 5600.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 5600.00 |
| සැපයුම් හා උපකරණ | 113162.00 | 127443.00 | 92667.00 | 0.00 | 0.00 | 0.00 | 333272.00 |
| ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තු | 9450.00 | 0.00 | 192559.00 | 0.00 | 0.00 | 0.00 | 202009.00 |
| ප්‍රවාහන, සම්බන්ධතා ආවශ්‍යක හා වෙනත් සේවා | 3500.00 | 24849.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 28349.00 |
| පොළී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 0.00 | 21042.81 | 0.00 | 0.00 | 0.00 | 5000.00 | 26042.81 |
| විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්ථන වැය එකතුව** | **2401905.00** | **1274348.81** | **2147343.24** | **63225.00** | **136826.00** | **4580314.00** | **10603962.05** |
| ප්‍රාග්ධන වියදම් | | | | | | | |
| ප්‍රාග්ධන වැය | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| ණය ආපසු ගෙවීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **0.00** |
| **පුනරාවර්ථන වැය හා ප්‍රාග්ධක වැය එකතු** | **2401905.00** | **1274348.81** | **2147343.24** | **63225.00** | **136826.00** | **4580314.00** | **10603962.05** |
| තැන්පත් | 2069171.00 | | | | | | 2069171.00 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජාතිය ගොඩනැගීමෙ බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බද්ද | 205685.21 | | | | | | 205685.21 |
| සේවක ණය | 112000.00 | | | | | | 112000.00 |
| අත්තිකාරම් | 24809.56 | | | | | | 24809.56 |
| ණයහිමි | 7367342.16 | | | | | | 7367342.16 |
| සමුච්චිත අරමුදල | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| වෙනත් | 0.00 | | | | | | 0.00 |
| **මුළු එකතුව** | **9779007.93** | | | | | | **20382969.98** |

**(උ) II. 2026 ජනවාරි ප්‍රා.ස.16 (මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 02 සඳහා අනිත් පිට බලන්න**

පඬුවස්නුවර ප්‍රාදේශිය සභාව — ප්‍රා.ස-16

මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය - 2026 ජනවාරි

| අය විෂය නාමයන් | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැළසුම් මංමාවත්/ඉඩම් හා ගොඩනැගිලි | ජල සේවා | වෙනත් උපයෝගී සේවා | සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 10 වරිපනම් හා බදු | 2186871.91 | 496400.00 | 0.00 | - | - | 53000.00 | 2736271.91 |
| 20 කුලී | 0.00 | - | 1064395.00 | - | 1595832.50 | 141700.00 | 2801927.50 |
| 30 බලපත්‍ර ගාස්තු | 100.00 | 256112.16 | - | - | - | 18950.00 | 275162.16 |
| 40 සේවා සඳහා ගාස්තු | 27000.00 | 408705.00 | 96971.00 | 0.00 | - | 490.00 | 533166.00 |
| 50 වරෙන්තු ගාස්තු හා දඩ | 1772339.00 | 0.00 | 7502.80 | 0.00 | 0.00 | 1106.00 | 1780947.80 |
| 60 වෙනත් ආදායම් | 95243.29 | 142810.00 | 51883482.44 | 36040.00 | 8760.00 | 210.00 | 52166545.73 |
| 70වෙනත් ආධාර | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **4081554.20** | **1304027.16** | **53052351.24** | **36040.00** | **1604592.50** | **215456.00** | 60294021.10 |
| **ප්‍රාග්ධන ආධාර** | | | | | | | |
| 80 මූලධන ලැබීම් | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| **පුනරාවර්තන ආදායම් හා ප්‍රාග්ධන ආදායම්වල එකතුව** | **4081554.20** | **1304027.16** | **53052351.24** | **36040.00** | **1604592.50** | **215456.00** | **60294021.10** |
| තැන්පත් | 324109.00 | | | | | | 324109.00 |
| වැට් | 0.00 | | | | | | 0.00 |
| ජා.ගො.බද්ද | 0.00 | | | | | | 0.00 |
| මුද්දර බදු | 26835.00 | | | | | | 26835.00 |
| සේවක ණය | 456285.00 | | | | | | 456285.00 |
| අත්තිකාරම් | 5000.00 | | | | | | 5000.00 |
| ණය ගැති | 847560.00 | | | | | | 847560.00 |
| සමු: අරමුදල | 0.00 | | | | | | 0.00 |
| සේවක ඇප ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| ආයෝජන | 0.00 | | | | | | 0.00 |
| අගරු චෙක් | 0.00 | | | | | | 0.00 |
| මුදල් මාරු | 0.00 | | | | | | 0.00 |
| ශීර්ෂ බැර | 7200.00 | | | | | | 7200.00 |
| **මුළු එකතුව** | **1666989.00** | | | | | | **61961010.10** |

**(උ) I11. 2026 ජනවාරි මස ප්‍රා.ස.07 (ශිඝ ආදායම් වාර්තාව) වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 03 සඳහා අනිත් පිට බලන්න**

| පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව | | | | | ප්‍රා.ස. 07 වාර්තාව - 2026 වර්ෂය | | | | මාසය:- ජනවාරි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | අය විෂය | මාසය මුලදී හිඟය<br>1 | මාසය මුලදී ඉදිරියට ලැබීම්<br>2 | මාසය තුළ බිල් කිරීම්<br>3 | ලැබිය යුතු මුළු ආදායම<br>4<br>(1+3) | මාසය තුළ ලද ආදායම<br>5 | මාසයට අදාල කලින් ලැබූ ආදායම<br>6 | ඉදිරියට ගෙන යන කලින් ලැබූ ආදායම<br>7<br>( 2-6) | මාසය තුළ ලද ආදායමින් ඉදිරියට ලැබූ ආදායම<br>8 | මාසය තුළ ලද ආදායමින් අය වූ හිඟය<br>9 | ඉදිරියට ගෙන යන හිඟය<br>10<br>4 - (5+6)+8 | ඉදිරියට ලැබීම්<br>11<br>(7+8) |
| 1 | වරිපනම් බදු 1/11 | 0.00 | 151,509.87 | 0.00 | 0.00 | 2,185,686.91 | 0.00 | 151,509.87 | 0.00 | 0.00 | 0.00 | 151,509.87 |
| 2 | අක්කර බදු 1/12 | 0.00 | 17,952.60 | 0.00 | 0.00 | 1,185.00 | 0.00 | 17,952.60 | 0.00 | 0.00 | 0.00 | 17,952.60 |
| 3 | කඩ කුලී 3/22 | 163,350.00 | 2,000.00 | 1,068,400.00 | 1,231,750.00 | 925,500.00 | 2,000.00 | 0.00 | 23,000.00 | 0.00 | 327,250.00 | 23,000.00 |
| 4 | වත්කම් බදු 5/23 | 0.00 | 0.00 | 1,690,342.50 | 1,690,342.50 | 604,272.50 | 0.00 | 0.00 | 14,925.00 | 0.00 | 1,100,995.00 | 14,925.00 |
| 5 | ජල ගාස්තු 4/62 | | 16,983.00 | 65,061.00 | 65,061.00 | 29,525.00 | 8,103.00 | 8,880.00 | 4,311.00 | 0.00 | 31,744.00 | 13,191.00 |
| 6 | ව්‍යාපාර බදු 2/16/ii | 0.00 | 0.00 | 479,400.00 | 479,400.00 | 479,400.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 7 | කර්මාන්ත බදු 2/16/1 | 0.00 | 0.00 | 14,000.00 | 14,000.00 | 14,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 8 | ඇතම් ව්‍යාපාර බදු 2/16/3 | 0.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | වෙළඳ බලපත්‍ර 2/31 | 0.00 | 0.00 | 159,862.16 | 159,862.16 | 159,862.16 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 10 | විශේෂ බලපත්‍ර ගාස්තු2/31 -II | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | එකතුව | **163,350.00** | **188,445.47** | **3,480,065.66** | **3,643,415.66** | **4,402,431.57** | **10,103.00** | **178,342.47** | **42,236.00** | **0.00** | **1,459,989.00** | **220,578.47** |

**(උ) IV. 2026 මාර්තු මාසික ආදායම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# <u>මාසික අදායම් පුරෝකථන වාර්තාව - පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව</u>

**මාසය :- 2026 මාර්තු**

| අනු අකය | ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව 2026 | | | මාසික ආදායම් පුරෝකථනය | | | අය වී ඇති ආදායම 2026 ජනවාරි | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අය - වැය ලේඛනය අනුව (1) | පරිපූරක මඟින් (2) | එකතුව3(1+2) | පෙර මාසය දක්වා (4) | මාසය තුළ(5) | එකතුව6(4+5) | පෙර මාසය දක්වා (7) | මාසය තුළ (8) | එකතුව 9 (7+8) |
| 1 | වරිපණම් ( 1/11) | 4,700,000.00 | 0.00 | 4,700,000.00 | 3,300,000.00 | 300,000.00 | 3,600,000.00 | 0.00 | 2,185,686.91 | 2,185,686.91 |
| 2 | අක්කර බදු ( 1/12 ) | 30,000.00 | 0.00 | 30,000.00 | 2,000.00 | 1,000.00 | 3,000.00 | 0.00 | 1,185.00 | 1,185.00 |
| 3 | කසල බදු(2/13) | 30,000.00 | 0.00 | 30,000.00 | 2,500.00 | 2,500.00 | 5,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 4 | කර්මාන්ත බදු(2/16/ii) | 60,000.00 | 0.00 | 60,000.00 | 10,000.00 | 5,000.00 | 15,000.00 | 0.00 | 14,000.00 | 14,000.00 |
| 5 | ඇතැම් ව්‍යාපාර බදු(2/16/x) | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 0.00 | 3,000.00 | 3,000.00 |
| 6 | ව්‍යාපාර බදු ( 2/16/i ) | 1,500,000.00 | 0.00 | 1,500,000.00 | 850,000.00 | 175,000.00 | 1,025,000.00 | 0.00 | 479,400.00 | 479,400.00 |
| 7 | බලපත්‍ර ගාස්තු ( 2/31/i) | 1,400,000.00 | 0.00 | 1,400,000.00 | 600,000.00 | 100,000.00 | 700,000.00 | 0.00 | 159,862.16 | 159,862.16 |
| 8 | විශේෂ බල:ගාස්තු(2/31/x) | 320,000.00 | 0.00 | 320,000.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| 9 | කඩ කුලී ( 3/22 ) | 12,192,000.00 | 0.00 | 12,192,000.00 | 2,032,000.00 | 1,016,000.00 | 3,048,000.00 | 0.00 | 925,500.00 | 925,500.00 |
| 10 | ජංගම අලෙවි කුටි ( 3/22-i) | 303,600.00 | 0.00 | 303,600.00 | 50,600.00 | 25,300.00 | 75,900.00 | 0.00 | 52,800.00 | 52,800.00 |
| 11 | පූජාභූමි වෙළඳ කුටි(3/22-ii) | 720,000.00 | 0.00 | 720,000.00 | 120,000.00 | 60,000.00 | 180,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 12 | ත්‍රි රෝද රථ නැවතුම් ගාස්තුව (03/43Xv) | 150,000.00 | 0.00 | 150,000.00 | 25,000.00 | 12,500.00 | 37,500.00 | 0.00 | 8,400.00 | 8,400.00 |
| 13 | ජල ගාස්තු(4/62/i,i) | 680,000.00 | 0.00 | 680,000.00 | 105,834.00 | 52,917.00 | 158,751.00 | 0.00 | 29,525.00 | 29,525.00 |
| 14 | සතිපොල බදු (5/22/i/iii/iV ) | 11,400,000.00 | 0.00 | 11,400,000.00 | 1,900,000.00 | 950,000.00 | 2,850,000.00 | 0.00 | 855,700.00 | 855,700.00 |
| 15 | බදු කුලී ( 5/23 ) | 20,000,000.00 | 0.00 | 20,000,000.00 | 2,378,000.00 | 1,958,000.00 | 4,336,000.00 | 0.00 | 604,272.50 | 604,272.50 |
| 16 | සතිපොල බහු.කාර්.ගොඩ5/2 | 50,000.00 | 0.00 | 50,000.00 | 10,000.00 | 0.00 | 10,000.00 | 0.00 | 0.00 | 0.00 |
| 17 | විනෝද බදු ( 6/15 ) | 750,000.00 | 0.00 | 750,000.00 | 125,000.00 | 62,500.00 | 187,500.00 | 0.00 | 58,000.00 | 58,000.00 |
| 18 | ප්‍රජා ශාලා/ක්‍රීඩා පි(6/25/ii/v) | 100,000.00 | 0.00 | 100,000.00 | 20,000.00 | 10,000.00 | 30,000.00 | 0.00 | 28,000.00 | 28,000.00 |
| | එකතුව | **54,388,600.00** | **0.00** | **54,388,600.00** | **11,533,934.00** | **4,730,717.00** | **16,264,651.00** | **0.00** | **5,405,331.57** | **5,405,331.57** |

**(උ) V.  2026 ජනවාරි මාසික වියදම් පුරෝකථන වාර්තාව සලකා බැලීම සඳහා මහා සභාවට ඉදිරිපත් කිරීම.**

**උපලේඛන 04 සඳහා අනිත් පිට බලන්න**

# මාසික වියදම් පුරෝකථන වාර්තාව - 2026 ජනවාරි

| අනු අංකය | වැය ශීර්ෂය | වාර්ෂික වියදම් ඇස්තමේන්තුව | | | වියදම් පුරෝකථනය | | | වැය කල මුදල | | | අතිරික්තය/ ඌනතාවය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අයවැය ලේඛනය | වැය ශීර්ෂ මාරු කිරීම / පරිපූරක | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | මාසය මුලදී | මාසය තුලදී | එකතුව | |
| 1 | වැටුප් දීමනා | 155,557,000.00 | - | 155,557,000.00 | - | 12,957,000.00 | 12,957,000.00 | - | 10,008,689.24 | 10,008,689.24 | 2,948,310.76 |
| 2 | ගමන් වියදම් | 935,000.00 | - | 935,000.00 | - | 5,000.00 | 5,000.00 | - | 5,600.00 | 5,600.00 | (600.00) |
| 3 | සැපයුම් හා උපකරණ | 18,846,500.00 | - | 18,846,500.00 | - | 850,000.00 | 850,000.00 | - | 333,272.00 | 333,272.00 | 516,728.00 |
| 4 | ප්‍රාග්ධන වත්කම් අළුත් වැඩියාව හා නඩත්තුව | 26,306,000.00 | - | 26,306,000.00 | - | 20,000.00 | 20,000.00 | - | 202,009.00 | 202,009.00 | (182,009.00) |
| 5 | ප්‍රවාහන සම්බන්ධතා , අවශ්‍යතා හා වෙනත් සේවා | 7,587,000.00 | - | 7,587,000.00 | - | 400,000.00 | 400,000.00 | - | 28,349.00 | 28,349.00 | 371,651.00 |
| 6 | පොලී ගෙවීම් , ලාභාංශ සහ ප්‍රසාද මුදල් | - | - | - | - | - | - | - | - | - | - |
| 7 | ආධාර මුදල් ,දායක මුදල් හා සහනාධාර | 8,681,000.00 | - | 8,681,000.00 | - | 100,000.00 | 100,000.00 | - | 26,042.81 | 26,042.81 | 73,957.19 |
| 8 | විශ්‍රාම වැටුප් ,විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 532,500.00 | - | 532,500.00 | - | 44,375.00 | 44,375.00 | - | - | - | 44,375.00 |
| 9 | උපකරණ වැය | 52,025,000.00 | - | 52,025,000.00 | - | 1,000,000.00 | 1,000,000.00 | - | - | - | 1,000,000.00 |
| 10 | ණය ආපසු ගෙවීම් | - | - | - | - | - | - | - | - | - | - |
| | එකතුව | 270,470,000.00 | - | 270,470,000.00 | | 15,376,375.00 | 15,376,375.00 | - | 10,603,962.05 | 10,603,962.05 | 4,772,412.95 |

**(උ). රැස්වීම කැඳවීමේ දැන්වීමේ වෙනත් කාරණා කිසිවක් දක්වා ඇත්නම්, ඒ කරුණු එහි දක්වා ඇති අනුපිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට - නැත.**

න්‍යාය පත්‍රානුකූලව ගරු සභාවේ කටයුතු අවසන් වූ බවත්,සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දායක වූ සැමට ස්තූතිය පිරිනමන බවත් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ප.ව.12.40 ට පමණ ගරු සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2026.03.10 දින පැවති පැවති මහා සභා රැස්වීම් වාර්තාව ගරු සභාවේ එදින පැමිනි සිටි සභිකයන් විසින් සභා සම්මත කරන ලදි

**<u>ගරු මන්ත්‍රී ඒ.පී.ඩී. ඉෂාන් මධුශංක පීරිස් මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව පිළිගැනීම සුදුසු බව මා යෝජනා කරනවා.

**<u>ගරු මන්ත්‍රී ජේ.එම්. දිලිප් ජයසිංහ මහතා - (ජා.ජ.බ)</u>**

2026.01.22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසීමේ කමිටුවේ වාර්තාව පිළිගැනීම සුදුසු බවට ගෙන ආ යෝජනාව මා ස්ථිර කරනවා.